ධර්ම දානය පිණිස යි.

# නිවැරදි භෝජනය සහ දානය

ලුණු අටුව සදහම් ග්‍රන්ථ - 06

ප්‍රථම මුද්‍රණය - ශ්‍රී බුද්ධ වර්ෂ 2603
- ක්‍රිතු දේව වර්ෂ 2014

- සිදුහත් බෝසත් උප්පත්ති වර්ෂ 2638
- සම්මා සම්බුද්ධ පිරිනිවන් වර්ෂ 2558

සම්පාදනය හා පිට කවර නිර්මාණය

ගල්ගමුවේ සාසන සිරි හිමි
ලුණු අටුව රජගල්ලෙන් ආරණ්‍ය, නවරත්නගොඩ, උඩතැන්න, මාතලේ

පරිගණක අකුරු සැකසුම

ෂෙරීකා ඈන්
අංක 07, නාගරික පොදු වෙළඳ සංකීර්ණය, ගොංගාවෙල පාර, මාතලේ
077 - 4104665
sherikacom@gmail.com

මුද්‍රණය

ඊසි ප්‍රින්ට්
අංක 20, උඩුපිටිය, උකුවෙල, මාතලේ
077 - 8787959 / 071 - 7772772 / 066 -2244062

පිට කවර නිර්මාණ සහාය

යස්මන් ජයවර්ධන මහතා - මාතලේ

ධර්ම දානය

නෙහාර දිල්මින් තරුණ මහතා - නවරත්නගොඩ

# ධර්ම දානයෙහි පරමාර්ථ

දහම් දැනුමෙන්, නිවැරදි අවබෝධයෙන්
මිසදිටු අවුලෙන් සහ
අවිදු අඳුරින් මිදී
ප්‍රඥාවේ ආලෝකය පිණිස.....!

# ආශිංසනය

සහාය වූ, ආධාර උපකාර කළ සැමට
මෙම දහම් පොත්වලින් නිසි ප්‍රයෝජන ගන්නා වූ
නුවණැති සත්පුරුෂයන්ට....

## මෙම පොත ගැන.......

මම නිදහස් වූ කෙනෙක් මි. ආයර්‍ය ශ්‍රාවකයෙක්මි යැයි හඳුන්වා ගන්නා ලද, ජීවිත මදයෙන් හා ආරෝග්‍ය මදයෙන් මත් වූ දේශකයෙක් හා ඔහුගේ ශ්‍රාවිකාවක් යැයි හඳුන්වන ලද කටකාර කාන්තාවක් දෙවරක් අප කරා පැමිණ, ඔවුන්ගේ මතය ඉදිරිපත් කළ අතර, ධර්මානුකූලව කරුණු කියා දුන් විට අමරා වික්ඛේපවාදයෙන් ලිස්සන පිළිතුරු දෙමින් මස්, මාළු වළඳන සියලුම වජ්ජි පුත්තක චීවරධාරියෝ සහ මස්, මාළු කන සියලුම ගිහියෝ දුස්ශීලයෝ යැයි කියමින් මේ වන විට ලක්ෂ ගාණක් පොත් පත්‍රිකා රට පුරා බෙදා හැර ඇති බව පවසන ලදි.

එමෙන් ජන සමාජයෙහි බොහෝ වාද විවාදයට ගෙන නිවැරදි භෝජනය වළඳන සිල්වත් ස්වාමීන් වහන්සේලාට දෙස් කියමින්, බොහෝ පව් පුරවාගෙන, අපාගත වන බොහෝ දෙනාගේ දැන ගැනීම සඳහා මෙවැනි පොතක් සම්පාදනය කිරීමට සිතුනි.

අන්‍යයන් ප්‍රාණඝාතයෙහි හා මස්, මාළු කෑමෙහි යොදවන ස්වල්ප මාත්‍ර අදහසක් අප තුළ නැත. සියල්ලෝ ම පර පණ නැසීමෙන් වළකිත්වා යන පවිත්‍ර චේතනාව අප තුළ ඇත. කැමැත්තෝ මස්, මාළු කත්වා. අකමැත්තෝ නොකත්වා. එහෙත් නොකන ඔබ, කන අයට දෙස් කියා බොහෝ අකුසල් නොකරත්වා. මිත්‍යා දෘෂ්ඨිය කුමක් ද? සම්මා දෘෂ්ඨිය කුමක් දැයි, දහම තුළින් අවබෝධ කෙරෙත්වා. කලු ගලෙහි හිස ගසා ගන්නාක් මෙන් සර්‍වඥතා ඥාණයට අභියෝග කරමින්, තර්කයෙන් සෙල්ලම් නොකරත්වා.

දිනක් කටුගස්තොට දී ධර්ම සාකච්ඡාවක් පැවැත්විණි. එහිදී මස්, මාළු කෑම ගැන ප්‍රශ්න කෙරුණ අතර, බුද්ධ දේශනයට අනුව පිළිතුරු දුනෙමි. අප පැමිණි පසු ඔය හාමුදුරුවෝ මස් කනවා ඇති. ඒකයි ඔහොම කීවේ යැයි ප්‍රශ්න ඇසූ පුද්ගලයා පවසා ඇත. පසු දිනක උදේම ඔහු වස ටැංකියක් කරේ එල්වාගෙන ගෙවත්තෙහි භෝගවලට ඉසිමින් සිටි බව දුටු අයෙක්ගේ මාර්ගයෙන් අපට දැන ගන්න ලැබිණි. එවැනි තවත් බොහෝ දෙනාට දැන ගැනීම පිණිස මෙම පොත සම්පාදනය කළෙමි.

මෙයට කතු හිමි

## මිළ කළ නොහැකි ධර්ම දානය

දානය වනාහී ශ්‍රම දානය, ආමිස දානය, අභය දානය, ධර්ම දානය කියා සතරාකාර වේ. අනුන්ගේ යහපත උදෙසා කයින් වැඩ කර දීම ශ්‍රම දානය යි.

සත්වයන්ගේ ජීවිත පැවැත්ම සඳහා ආහාර පානාදිය දීම ආමිස දානය යි. ඒවා උපකාරවනුයේ ද මේ කුණු කය පෝෂණය සඳහාම ය. එක් ආහාර වේලකින් ලබන්නාට උපරිම වශයෙන් දින හතකට ශක්තිය ලැබේ. අවම වශයෙන් පැය කිහිපයකට පමණි. වස්ත්‍රාභරණාදිය ද සීමිත කාලයකට පමණක් ප්‍රයෝජන ලැබේ.

ආමිස දානය දෙන කෙනාට විපාක වශයෙන් භව සම්පත් තාවකාලිකව ලබා දෙමින් ඒවා සසර දුකට ම ප්‍රත්‍ය වේ. නිවන් පතා දන් දුන්නත් එයින් නිවන නොලැබේ. එය නිවන් මඟට ආධාර වේ. ධර්මය අසා ම, ධර්මය අනුගමනය කර, ධර්මය දැනගෙන ම නිවන් අවබෝධ වේ.

අභය දානය ද උතුම් දානයකි. අභය දානය නම් ශීලය යි. පස් පවින් වැළකීම අභය දානය යි. එයින් අපමණ සත්වයින්ට අභය, අවෛරය, නිදුක් බව දීම වේ. සතුන් මරණයෙන් ගැලවීම ද, අභය දානය යි. එයින් අසාරවත් ආදීනව පිරි භව සම්පත් ම ලැබේ.

යමෙක් මේ මහපොළොව සමතලා කර, බුදු පසේ බුදු මහ රහතන් වහන්සේලා පේළියෙන් පේළියට වඩා හිඳුවා, තුන් සිවුරු සහිත මහ දානයක් දුන්නොත් එහි දී සතර පද ගාථාවකින් ධර්ම දේශණාවක් කළොත් ධර්ම දානානිසංස ලඟ එම මහා දානය දහසයෙන් කොටසක්වත් නොවටින්නේ ය.

අනාථ පිණ්ඩික සිටුතුමා පනස් සතර කෝටියක් ද, විශාඛාව විසි හත් කෝටියක් ද, ධර්මාශෝක රජු අනූ හය කෝටියක් ද වැය කරමින් විහාරස්ථාන කරවා ජීවිතාන්තය දක්වා ආමිස දන දුන්නේ ධර්මය ඇසීම නිසාවෙනි.

මිනිසුන් මැරූ අංගුලිමාල අහිංසක වූයේ ද, පටාචාරා, කිසාගෝතමීලා මානසික සුව ලැබුයේ ද, ආලවක ආදී යකුන් දමනය වූයේ ද ධර්මය ඇසීම නිසාවෙනි. අධමයන් දමනය වන්නේ ද, අසත්පුරුෂයෝ සත් පුරුෂ වන්නේ ද, පාපීහු පින්වතුන් වන්නේ ද, දුශ්සීලයෝ සිල්වතුන් වන්නේ ද, සතුරෝ මිතුරෝ වන්නේ ද ධර්ම බලයෙනි.

ශ්‍රම දන, ආමිස දන, අභය දන දෙමින් පින් කරන්නේ ද ධර්මය ඇසීමෙන් ය. මෙබඳු වූ උතුම් ධර්මය ලාභ සත්කාර, කීර්ති ප්‍රශංසා සඳහා ද මැරුණ අයට පින් දීමට හා ජීවත් වන අයට බොහෝ කල් දුක් විඳ විඳ සිටීමට දීර්ඝායුෂ පතා ආශිර්වාද පිණිස යැයි මේ නොවටිනා, අසාරවත් දේ සඳහා යොදා ගන්නේ ධර්මයෙහි ඇති වටිනාකම නොදැනීම නිසයි.

තමාටත් අනුන්ටත් ධර්මාවබෝධයෙන් යථාර්ථය දැක දුකෙන් මිදී, නිවන සඳහා ම ධර්ම දේශනා කිරීම, කරවීම, ලිවීම, ලියවීම, උගෙනීම, උගැන්වීම, මුද්‍රණය කරවා නොමිලේ බෙදා දීම උතුම්ම ම ධර්ම දනය යි.

ධර්ම දේශනාවක දී අසිහියෙන් ඇසුවොත් එයින් ප්‍රයෝජන නැත. සිහියෙන් ඇසුවොත් පසුව අමතක වේ. නමුත් පොත තිබුණොත් නැවත කියවා දැනුම අලුත් කර ගත හැකි ය. බොහෝ දෙනෙකුට ප්‍රයෝජන ගත හැකි ය. නැවත මුද්‍රණය කරවීමෙන් පරම්පරා ගණනකට පොතෙන් වැඩ සලසා ගත හැකි ය. එබැවින් මෙම කරුණු දැනගෙන ධර්ම දනය කරන්නෝ සතුට, ධර්ම ප්‍රීතිය ලබත්වා. දහම් පොත කියවන්නෝ මෙහි වටිනාකම හඳුනාගෙන ධර්ම දනය පිණිස සිත් උපදවත්වා. මේ සඳහා ම සැමට හොඳ නුවණ වේවා.

# ජීවක සූත්‍රය - (මජ්ඣිම නිකාය)

භාග්‍යවත් වූ බුදු රජාණන් වහන්සේ එක් කාලයක මගධ දේශයෙහි පිහිටි ජීවක වෙද මහතා විසින් පූජා කරන ලද අඹ උයනෙහි වැඩ වසන කල්හී, ජීවක වෙද මහතා පැමිණ භාග්‍යවතුන් වහන්සේට වැඳ පසෙකින් හිඳ ඔබ වහන්සේ විසින් තමන් උදෙසා මරණ ලද්ද වූ සත්ව මාංශය දැන දැන වළඳනවා යැයි කියන කථාවක් මට අසන්න ලැබී ඇත. එය සත්‍යයක් දැයි ඇසුවේ ය.

එවිට භාග්‍යවතුන් වහන්සේ ජීවකය, එය අසත්‍යයකි. බොරුවෙන් කරන චෝදනාවකි. තමා වෙනුවෙන් මරණ බව නොදුටුවා නම්, නො ඇසුවා නම්, සැක ඇති නොවුනේ නම්, එවැනි මාංශය වැළඳුවාට වරදක් නැති බව මා විසින් ප්‍රකාශ කර ඇත.

ජීවකය, යම් භික්ෂුවක් සිවු දිසාවට මෙත් වඩමින්, යම් ගමක් හෝ ජනපදයක් ඇසුරු කරගෙන වසයි. සද්ධාව ඇති අයෙක් පැමිණ, දානයට ආරාධනා කරයි. ආරාධනාව ලැබූ භික්ෂුව එම ආරාධනාව පරිදි මෙම සැදැහැති කෙනා අද මට මස් මාළු සහිත ප්‍රණීත දානය දෙනවා නම් හොඳයි. මතුවටත් එසේ ම දෙනවා නම් හොඳ යැයි නොසිතා, එම නිවසට වඩියි. ලැබෙන්නා වූ දෙය කුමක් හෝ තෘෂ්ණාවෙන් නොබැඳී, ගිජු නොවී, මේ ප්‍රණීත ආහාරය ඇනූ තැන් පටන් කුස තුළට ඇතුල් වී, පිළිකුල් බවට පත්වෙන බව ආදීනව වශයෙන් සලකා මෙම ආහාරය කයේ පැවැත්ම සඳහා, ජීවත්වීම සඳහා, කුස ගිනි වේදනාව දුරු කර ගැනීම සඳහා බ්‍රහ්ම චරියාව පිණිස උපකාර වේ යැයි නුවණින් කරුනු මෙනෙහි කරමින් වළඳයි.

ජීවකය, එම භික්ෂුව තමාට හිංසාව පිණිස හෝ අන්‍යයන්ට හිංසාව පිණිස ක්‍රියා කරන්නේ ද? භාග්‍යවතුන් වහන්ස, නැත. ජීවකය, එම භික්ෂුව නිවැරදි ආහාරය වළඳන්නේ ද නොවන්නේ ද? භාග්‍යවතුන් වහන්ස, නිවැරදි ආහාරය වළඳන්නේ ය. බ්‍රහ්මයා මෛත්‍රියෙන් යුතුව වසන්නේ ය යනු මම අසා ඇත්තෙමි. භාග්‍යවතුන් වහන්සේ ද එලෙසින් ම සියලු සත්වයන් වෙත මෙත් සිතින් වසන බව මම දනිමි.

ජීවකය, යමෙක් භාග්‍යවතුන් වහන්සේ හෝ තථාගත

ශ්‍රාවකයන් උදෙසා හෝ සතුන් මරයි නම් ඔහු බොහෝ පවු රැස් කර ගනියි. මැරීම සඳහා අසවල් සතා ගෙනෙන්න යැයි අණ කෙරේ ද, මේ පළමු කරුණින් හෙතෙම පවු රැස් කර ගනී. එසේ ගෙනෙන විට එම සත්වයා යම් කායික, මානසික දුකක් විඳී ද, ඒ හේතුවෙන් ද පවු රැස් කර ගනී. සත්වයා ගෙනා පසු මරවයි කියා අණ කිරීමේ දී මේ තුන් වෙනි කරුණින් ද බොහෝ පවු රැස් කර ගනී. සතා මරණ විට යම් කායික, මානසික දුකක් විඳී ද, මේ සතරවෙනි කරුණින් ද බොහෝ පවු රැස් කර ගනී. එමෙන් ම තථාගතයන් වහන්සේගේ ශ්‍රාවකයෝ අකැප වූ මස් මාළු වළඳතියි චෝදනා කෙරේ ද මේ පස්වෙනි කරුනින් ද බොහෝ පවු රැස් කර ගනී යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## ආමගන්ධ සූත්‍රය - (සූත්‍ර නිපාතය)

බුදු රජාණන් වහන්සේ පහළවීමට පෙර, එක් බ්‍රාහ්මණයෙක් පිරිසක් සමඟ පැවිදිව, තවුස්දම් පුරමින් හිමාල පෙදෙසෙහි වාසය කළ අතර, මස් මාළු අනුභව නොකරන ලදි. අල, කොළ, ගෙඩි ජාති පරිභෝග කළ අතර, ලුණු ඇඹුල් මිශ්‍ර ආහාර ලබා ගැනීමට, වර්ෂා කාලයට මිනිස් වාසයට පැමිණෙන අතර, එහිදී මනුෂ්‍යයෝ හොඳින් සත්කාර කළෝ ය.

බුදු රජාණන් වහන්සේ පහළ වූ පසු එම පළාතට වැඩම කර, ධර්ම දේශනා කළ පසු, බොහෝ දෙනා සෝතාපන්න, සකදාගාමි, අනාගාමී මාර්ග ඵලවලට පත් වූහ. බුදු රජාණන් වහන්සේ සැවැත් නුවරට ආපසු වැඩි සේක.

නැවත තාපස පිරිස පැමිණි පසු ගම් වැසියෝ පෙර මෙන් සත්කාර නොකළහ. එයට කරුනු විමසූ විට, බුදු රජාණන් වහන්සේ ධර්ම දේශනා කළ පසු මේ වෙනස වී ඇති බව දැන්වූහ. ඔය බුදු රජාණන් වහන්සේ ආමගන්ධය වළඳනවා ද? ආමගන්ධය යනු කුමක් ද? ආමගන්ධය කියන්නේ මස්, මාළුවලට ඒවා නම් බුදු රජාණන් වහන්සේ වැළඳූ බව ගම් වැසියෝ පැවසූහ.

එසේ නම් බුදු කෙනෙක් නොවිය හැකි ය. එහෙත් බුද්ධ යන වචනයත් දුර්ලභ යි. එනිසා මම ම ගොස් දැන ගන්න ඕනෑ යැයි සිතූ

තාපසතුමා සැවැත් නුවරට ගොස්, බුදු රජාණන් වහන්සේට නොවැඳ, පසෙකින් වාඩි වී, තොරතුරු කථා කිරීමෙන් පසු, ඔබ වහන්සේ ආමගන්ධය වළඳනවා ද? බමුණ ආමගන්ධය යනු කුමක් ද? පින්වත් ගෞතමයන් වහන්ස, ආමගන්ධය නම් මස්, මාළු ය. බමුණ මස් මාළු ආමගන්ධය නොවේ. ආමගන්ධය නම් සියලු කෙලෙස් ධර්ම යි.

මේ ප්‍රශ්නය ඔබ පමණක් නොවේ, අතීතයෙහි තිස්ස නම් බ්‍රහ්මණයෙකුත් කාශ්‍යප බුදු රජාණන් වහන්සේගෙන් ද අසා ඇත. කාශ්‍යප බෝධිසත්වයන් වහන්සේ සමඟ එක දිනයෙහිම තවත් දරුවෙක් උපන්නේ ය. ඔහුට තිස්ස යැයි නම් තබන ලදි. කාශ්‍යප කුමාරයා පැවිදිව බුදු වන්නේ ය. එබැවින් ඔබත් පැවිදි වෙන්න යැයි තිස්සගේ පියා විසින් කියන ලදුව ඔහු කල් ඇතිවම පැවිදි විය. අල, කොළ, ගෙඩි වර්ග ආහාරයට ගනිමින් වනයේ තවුස් දම් පිරී ය.

මේ අතර, කාශ්‍යප කුමාරා පැවිදිව බුදු බවට පත්විය. දිනක් වනයට ගිය පුරුෂයෙකුගෙන් ඒ බව දැන ගත්තේ ය. ඔහු සත්ව මාංශවලින් වැළකී සිටින නිසා බුදු රජාණන් වහන්සේ ආමගන්ධය වළඳනවා දැයි ඇසූ විට, ආමගන්ධය යනු කුමක්දැයි පුරුෂයා විසින් අසන ලදුව මස්, මාළු යැයි තාපසතුමා විසින් පැවසූ කල්හී උන් වහන්සේ මස් මාළු වළඳන බව දැනුම් දුන්නේ ය.

මම මේ ගැන ගිහින් ම දැන ගනිමි. ඉතින් වළඳන්නේ නම් ඔබ වහන්සේගේ ගෝත්‍රයට ද, කුලයට ද නොසුදුසු බව කියා වළක්වා උන් වහන්සේ ලඟ පැවිදිව, සසර දුකින් මිදෙමියි තාපසතුමා ඉසිපතනයට ගොස් නොවැඳම, පසෙකින් හිඳ තොරතුරු කතා කර, මෙසේ ඇසී ය. ඔබ වහන්සේ ආමගන්ධය වළඳනව ද, නැද්ද? බමුණ, ආමගන්ධය මට කැප නොවේ යැයි වදාළ සේක. බොහොම හොඳයි කාශ්‍යපයෙනි, අන් සතුන්ගේ කුණප නොකෑම ඉතාම යහපත් ක්‍රියාවකි. එය ඔබේ කුලයටත්, ගෝත්‍රයටත්, බ්‍රාහ්මණ ජාතියට ද සුදුසුම දෙයකි. යැයි බමුණා කීය.

ආමගන්ධය මට කැප නොවේ යැයි මම කෙලෙස් සඳහා කීවෙමි. එහෙත් මස්, මාළු ආමගන්ධය යැයි මොහු සිතයි. එනිසා හෙට

දින පිණ්ඩපාතේ නොගොස් මෙහිම නවතිමි. එවිට කිකී රජතුමා විසින් එවන ලද රස මස් අවුළු සහිත දානය වළඳිමි. එවිට මොහු ආමගන්ධය ගැන කථා උපදවයි. ඉන් පසු මොහුට ධර්මානුකූලව කරුණු පහදා දෙමි යැයි සිතා පසු දින විහාරයෙහිම නැවතුන සේක.

තාපසතුමා කොළ තම්බා අනුභව කර විහාරයෙහිම නැවතී සිටියේ ය. කිකී රජතුමා විසින් දානය එවන ලදුව, තාපසතුමාට පෙනෙන පරිදි කැඳ බඳුනෙහි තිබූ මස් කැබැල්ලක් කටේ තබා ගෙන කැඳ වළඳා, දෙවනු මාංශ භෝජන සහිතව දානය වළඳනවා දුටු තාපසතුමාට තරහක් ඇති විය.

දානය වළඳා අවසන් වූ පසු, තාපසතුමා මෙසේ චෝදනා කළේ ය. කාශ්‍යපයෙනි, ඔබ බොරු කියන්නෙහි ය. එය නොසුදුසු ය. කැළයේ වසමින්, අල, කොළ, ගෙඩි වර්ග අනුභව කරමින්, තවුස් දම් පුරන අයවත් බොරු නොකියති. ඔබ ආමගන්ධය මට කැප නොවේ යැයි කියා දැන් ඇල් හාලේ බත් සමඟ මස් අනුභව කළෙහි යැයි පැවසී ය.

නැවත දෙතිස් මහා පුරුෂ ලකුණු ඇති මුන් වහන්සේ බොරුකීමට සුදුසු කෙනෙක් නොවේ. මුන් වහන්සේගේ ආමගන්ධය වෙන දෙයක් විය හැකි යැයි සිතා, ඔබේ අමගන්ධය කුමක්දැයි ඇසීය.

බ්‍රාහ්මණය, සතුන් මැරීම ද, සත්වයන්ට වද දීම ද, බැඳ දැමීම ද, අත පය කැපීම, සොරකම ද, බොරුවද, දෙමියි කියා පසුව නොදීම ද, වඤ්චා කිරීම ද, අනර්ථය පිණිස හේතු වන දේ ඉගෙනීම ද, අනුන්ගේ බිරියන් සමඟ අනාචාරේ හැසිරීම ද යන මේවා ආමගන්ධය යි. මස් මාළු ආමගන්ධය නොවේ.

කාමයන් කෙරෙහි අසංවරවීම ද, රසවත් දෙයෙහි දැඩි ගිජු බව ද, කය, සිත, වචනවලින් අපිරිසිදු ක්‍රියා ද, කර්ම හා විපාක පිළිනොගන්නා මිත්‍යා දිට්ඨිය ද, විශම පැවතුම් ද, අන්තයට ගිය, අත නොහරින වැරදි අදහස් ඇති බව ද ආමගන්ධය යි. මස්, මාළු නොවේ.

අත්තකිලමථානුයෝග නම් වූ තමාටම දුක් ඇති කර ගන්නා වූ රූක්ෂ පිළිවෙත් පිරීම ද, කියන දේ පිළිනොපදින දරදඬු ගතිය ද,

ඉදිරියෙහි ගුණ කියා, නැති තැන දෙස් කීම ද, මිත්‍රද්‍රෝහීකම ද, අකාරුණික බවද, දැඩි මානය ද, පරිත්‍යාග නොකිරීම ද, ආමගන්ධය යි. මස්, මාළු ආමගන්ධ නොවේ.

ක්‍රෝධය ද, උඩගු බවද, ගුණවතුන්ට ගරු නොකරන දැඩි ගතිය ද, සැම විටම, සැම දෙයටම විරුද්ධ ක්‍රියා කිරීම ද, තමාගේ වැරදි සැඟවීම ද, ඉරිසියාව ද, නිතර තමා උසස් කර කථා කිරීම ද, තමා උසස් යැයි සිතන දැඩි මානය ද, ආමගන්ධ වේ. මස්, මාළු ආමගන්ධ නොවේ.

ලෝභයෙන් ගිජුව, ද්වේශයෙන් විරුද්ධව, මෝහෙන් මුලාව, නිතර අකුසලයට ම බරව පව්කම් කරයි ද, මරණින් පසු එබඳු අය පා උඩුකුරුව, හිස යටිකුරුව නිරයට වැටේ. එම පව්කම් ආමගන්ධය යි. මස් මාළු ආමගන්ධ නොවේ.

මස්, මාළු නොවැළඳීමෙන්, නිරුවත්ව වාසය කිරීමෙන්, හිස මුඩු කිරීමෙන්, ජටා බැඳගෙන දූවිලි නොසෝද, සිටීමෙන්, ගින්න පිදීමෙන්, සිරුර තැවීමෙන්, වේදයෙන්, සත්ව බිලි පූජාවෙන්, අව්වේ සිටීමෙන්, වැස්සට තෙමී දියේ ගිලී පව් සේදීමෙන්, සත්වයෝ කෙළෙසුන්ගෙන් පිරිසිදු නොවේ. සැක දුරු නොවේ.

(මස්, මාළු නොවැළඳූ ආමගන්ධ තවුසා එයින් කෙළෙස් දුරු වී, පිරිසිදු නොවූ බැවිනුත් සැක දුරු නොවූ බැවිනුත් බුදු රජාණන් වහන්සේ ගැන සැක කළේ ය.)

ඇස, කන, නාසය, දිව, කය, මනස ආරක්‍ෂා කරගෙන, සිල්වත්ව, විදර්ශනා භාවනා කරමින්, අවංක පිළිවෙතින් මෘදු ගුණයෙන් යුතුව රාග, ද්වේස, දුරු කිරීමෙන්, සියලු කෙළෙස් නසා, ආමගන්ධ වූ කෙළෙස්වල නොඇලී, සියලු දුක් දුරු කරන්නේ ය වශයෙන් බුදු රජාණන් වහන්සේ විසින් වදාළ දහම් අසා තිස්ස නම් බ්‍රාහ්මණ තාපසතුමා සාසන පැවිද්ද ලබා කාශ්‍යප බුදු රජාණන් වහන්සේගේ අග්‍ර ශ්‍රාවක තනතුර ද ලබා සසර දුකින් ද මිදුණේ ය. මේ ආමගන්ධ තාපසතුමා ද ගෝල පිරිස සමඟ අපේ බුදු රජාණන් වහන්සේ ළඟ පැවිදිව වැරදි දෘෂ්ටිය අතහැර රහත් බවට පත් විය.

## මංස ජාතකය - (ජාතක අට්ඨ කථා)

එක් කලෙක තථාගතයන් වහන්සේ ජේතවනාරාමයෙහි වාසය කරන කල්හී, ඇතැම් ස්වාමීන් වහන්සේලා විරේක බෙහෙත් වළඳ, මස් හොදි සහිත දනය අවශ්‍ය බව බත් විකුණන වීදියෙහි පිණ්ඩපාතේ ගොස් හිස් අතින් ආපසු වඩිනු දුටු අග්‍ර ශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේ එම වීදියටම වැඩම කළ විට මනුෂ්‍යයෝ පාත්‍ර පුරවා දුන්නේ ය.

ඒ ගැන කථා කරන විට භාග්‍යවතුන් වහන්සේ එතැනට පැමිණ, **න භික්ඛවෙ ඉදනි සාරිපුතො වරමංසං ලභි** - මහණෙනි, දැන් උතුම් මස් රස ලැබුවේ සාරිපුත්ත පමණක් නොවේ පෙරද මෘදු වූ, ප්‍රිය වචන කථා කරන්න දක්ෂ අය ලැබූහ යැයි වදාළ සේක.

අතීතයෙහි බරණැස් නුවර සිටු පුත්‍රයන් සතර දෙනෙක් පාර අයිනෙහි ඉන්නා විට දඩයම්කරුවෙක් කරත්තයක මස් පටවාගෙන යනු දුටුවෝ ය. සතර දෙනාගෙන් කෙනෙක් ගොස් බොල වැද්දෝ මට මස් කැබැල්ලක් දෙනන් යැයි කීවේ ය. එම වචනවලින් සතුටු නොවූ ඔහු දළඹු සහිත මස් කැබැල්ලක් දුන්නේ ය.

තව කෙනෙක් ගොස් සහෝදරයා මට මස් කැබැල්ලක් දෙන්නැයි ඉල්වී ය. සහෝදරයා යනු සිරුරේ කොටසක් හා සමානයි. එනිසා ඔබට එක් කොටසක් දෙම් යැයි මස් කොටසක් දුන්නේ ය.

තුන් වැනියා ගොස් පියාණෙනි, මටත් මස් කැබැල්ලක් දෙන්නැයි ඉල්වී ය. පියාණෙනි, යැයි දරුවෙන් අමතන විට පියෙකුගේ හදවත කම්පා වේ. එබැවින් ඔබට හෘදය මාංශය දෙම්යි කියා හදවත් කොටස දුන්නේ ය.

සිවු වැනියා ගොස් යාලුවේ මටත් මස් කැබැල්ලක් දෙන්නැයි ඉල්වී ය. යම් ගමක සැප දුක ආදී සියලු දෙයට උදව් වෙන යහලුවෙක් නැති නම් ඒ ගම කැළයක් හා සමානයි. ඒ නිසා ඔබේ වචනයට අනුවම දෙම් යැයි කියා මස් කරත්තයම ඔහුගේ නිවසටම ගෙන ගියේ ය. ඉන් පසු එම සිටු පුත්‍රයා දඩයම්කරුගේ අඹු දරුවන් ද ගෙන්වා තම

වස්තුවෙන් භාගයක් දී ඔහු සතුන් මැරීමෙන් වළක්වා මිත්‍රත්වයෙන් විසූහ. දඩයම්කරු අවසන් ජීවිතයේ සාරිපුත්ත තෙරණුවෝ ය. ප්‍රිය වචනයෙන් කථා කළ සිටු පුත්‍රයා අවසන් ජීවියෙහි අපේ බුදු රජාණන් වහන්සේ ය.

## මනාපදායි සූත්‍රය - (අංගුත්තර නිකාය - පඤ්චක නිපාතය)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ විශාලා නුවර කූටාගාරයෙහි වැඩ වසන විට උග්ග ගෘහපතිතුමාගේ නිවසට වැඩි සේක. උග්ග ගෘහපතිතුමා භාග්‍යවතුන් වහන්සේට වැඳ, මෙබඳු ප්‍රකාශයක් කළේ ය. කැමති දෙය දෙන කෙනා කැමති දෙය ලබන බව භාග්‍යවතුන් වහන්සේගෙන් අසා ඇත්තෙමි. මම **(සාලපුප්ඵ ඛාදනියං)** සල් මල් කැවිලිවලට කැමැත්තෙමි. එබැවින් මට අනුකම්පාවෙන් මේ කැවිලි පිළිගන්නා සේක්වා භාග්‍යවතුන් වහන්සේ අනුකම්පාවෙන් පිළිගත් සේක.

භාග්‍යවතුන් වහන්ස, **(සම්පන්න කොලකං සූකර මංසං)** ගම්මිරිස් යොදන ලද ඌරු මස්වලට මම කැමැත්තෙමි. එබැවින් කැමති දේ ලබන්න භාග්‍යවතුන් වහන්සේට පූජා කරන මේ සූකර මාංශය මට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ පිළිගත් සේක.

භාග්‍යවතුන් වහන්ස, ගිතෙලින් බදින ලද නාලිය පලාවලට මම කැමැත්තෙමි. කැමති දේ ලැබීම පිණිස මේ පූජා කරන මේ නාලිය පලා මට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා.

භාග්‍යවතුන් වහන්ස, නොයෙක් සූප ව්‍යඤ්ජන සහිත කලු ඇට ඉවත් කළ, ඇල් හාලේ බතට මම කැමැත්තෙමි. එබැවින් කැමති දේ ලැබීම පිණිස පූජා කරන මේ ඇල් හාලේ බතට මම කැමැත්තෙමි. එබැවින් කැමති දේ ලැබීම පිණිස පූජා කරන මේ ඇල් හාලේ බත මට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ පිළිගත් සේක.

භාග්‍යවතුන් වහන්ස, කසී රටෙහි වියන ලද වස්ත්‍රවලට මම කැමැත්තෙමි. කැමති දේ ලැබීම පිණිස පූජා කරන මේ කසී වස්ත්‍ර මට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ පිළිගත් සේක.

භාග්‍යවතුන් වහන්ස, සිංහ පාද යෙදූ සිව් අඟලකට වඩා දිග ලොම් ඇතිරිලි, විසිතුරු මලින් සැරසූ ගණකම් පලස් යෙදූ කෙසෙල්මුවසමින් යුතු හිසට හා පයට රතු කොට්ට යෙදූ උඩු වියන් සහිත ඇඳන්වලට මම කැමැත්තෙමි. එහෙත් ඒවා භාග්‍යවතුන් වහන්සේට නොසුදුසු බව දනිමි. එබැවින් සඳුන් ලීයෙන් කරවන ලද කහවනු දහසකට වඩා වටිනාකම ඇති ආසනය මට අනුකම්පාවෙන් පිළිගන්නා සේක්වා. භාග්‍යවතුන් වහන්සේ පිළිගත් සේක.

යමෙක් අවංක සිත් ඇති අය කෙරෙහි කැමැත්තෙන් ම වස්ත්‍ර, සයනාසන, ආහාරපාන ආදී තමා කැමති සිවුපසය දේ නම්, ඔහු කැමති දේ ලබන්නේ ය.

රහතන් වහන්සේලා උතුම්ම පින් කෙතක් බව දැනගෙන, දීමට අමාරු තමා කැමති දේවල්, බලාපොරොත්තු අතහැර, සිතින් අල්වා නොගන යම් සත් පුරුෂයෙක් දේ නම් ඔහු කැමති දේ ම ලබන්නේ යැයි භාග්‍යවතුන් වහන්සේ අනුමෝදනා කර, වැඩි සේක.

පසු කාලයේ අනාගාමී ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වූ උග්ග ගෘහපතිතුමා මරණින් පසු සුද්ධාවාස බ්‍රහ්ම ලෝකයෙහි ඉපිද භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණි කල්හී උග්ගයෙනි, ඔබ සිතූ පරිදිම පැතූ දේවල් ලැබුනා දැයි ඇසූ විට අදහස් පරිදි සියල්ල ඉටු වූ බව එතුමා පැවසී ය.

තමා කැමති දේ දෙන කෙනා කැමති දේ ලබයි. අග්‍ර දේ දෙන කෙනා අග්‍ර දේ ලබයි. උතුම් දේ දෙන කෙනා උතුම් දේ ලබයි. උසස් දේ දෙන කෙනා උසස් දේ ලබයි. යමෙක් අග්‍ර දේ, උතුම් දේ, ශ්‍රේෂ්ඨ දේ දෙයි ද එම මිනිසා යම් යම් තැනක දීර්ඝායුෂ හා යසස ලබන්නේ යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## රහත් තෙරණිය දුන් මාංශ දානය

දෙවන අග්‍ර ශ්‍රාවිකා තනතුර ලැබූ උප්පල වණ්ණා තෙරණින් වහන්සේ එක් කලෙක සැවැත් නුවර සමීපයෙහි අන්ධ වනයෙහි විවේකව හුන්නා ය. සොර පිරිසක් සත්වයෙකු මරා මස් රැගෙන යන විට තෙරණින් වහන්සේ දුටුවේ ය. ගෝල පිරිස දුටුවොත් කරදරයක් කරාවි යැයි සිතා ඔවුන් වෙනත් පැත්තකින් යවා තෙරණින් වහන්සේ සමීපයෙහි ගසක මස් කොටසක් එල්වා කැමති කෙනෙක් ගනීවා. යැයි තෙරණින් වහන්සේට ඇසෙන සේ කියා ගියේ ය.

ඔහු සතුන් මරණ, පවුකාරයෙක් වුවත් සිල්වතුන්ට ගරු කරන, ආචාර ධර්ම දන්නා වූ කෙනෙකි. වනයේ තනිව ඉන්නා වූ තෙරණින් වහන්සේ ලඟට පිරිමියෙක් තනිව යාම නොසුදුසු බැවින් ද විවේකව සිටි නිසා විවේකයට බාධා නොකිරීමට සිතන්න ඇති.

තෙරණින් වහන්සේ එම මස් කොටස ආරාමයට ගෙන ගොස් ව්‍යඤ්ජනයක් ලෙස සකසා අහසින් ඉද්ධි බලෙන් රජගහ නුවර වේළුවනාරාමයට ගෙන ගොස් උදායී තෙරුන් වහන්සේට බාර දී භාග්‍යවතුන් වහන්සේට පිළිගන්වන්න යැයි පැවසුවා ය. එවිට නැගණියනි, ඔබ විසින් භාග්‍යවතුන් වහන්සේට මසින් පුදන ලදි. එම නිසා මට අඳනය දෙන්නැයි කියා බල කර, ඉල්වන ලදුව තෙරණිය අඳනය දී ආරාමයට ගියාය. සෙසු භික්ෂුණීන් වහන්සේලා එය දැනගෙන දෙස් කියා භික්ෂූන්ට දැන්වූයෝ ය. එය දැනගත් භාග්‍යවතුන් වහන්සේ සඟ පිරිස අමතා මහණෙනි, ඥාති නොවන භික්ෂුණියකගෙන් චීවරයක් පිළි නොගත යුතු යැයි ශික්ෂා පදයක් ද පැනවූ සේක. (විනය පිටකය - පාරාජිකා පාළි නිසගි පචිති චීවර වර්ගය).

## තරුණ පසන්න මහ ඇමතිගේ දානය

තෙරුවන් කෙරෙහි පැහැදුන එක් මහ ඇමතිවරයෙක් පසු දින දානය සඳහා චාරිකාවේ වඩිමින් අන්ධක වින්ද ප්‍රදේශයේ දී එක් දහස් දෙසිය පණහක් සඟ පිරිස සහ භාග්‍යවතුන් වහන්සේට ආරාධනා කළේ ය.

මේ එක් දහස් දෙසිය පනස් නමටම එක් මස් තලිය බැගින් දෙන්න ඕනෑ යැයි සිතා දානය සූදානම් කරවීය. නියමිත වෙලාවට දානය බෙදන විට ටික ටික බෙදන්න යැයි ස්වාමීන් වහන්සේලා පැවසූහ. ස්වාමීන් වහන්ස, මං අලුත පැහැදුන කෙනෙක් යැයි සිතා ටික ටික නොගන්න. මම සෑමදෙනා වහන්සේලාට ඇති පමණට දානය සූදානම් කළෙමි. එක් නමකට එක බැගින් මස් තලිද සූදානම් කර ඇත්තෙමි.

ඇමතිතුමනි, අපි කල් ඇතිව කැඳ වළඳා පැමිණි බැවින් කුසගිනි අඩු නිසා ටික ටික ගත්තෙමු.

මෙපමණ පිරිසකට දානය දෙන්න බැහැ කියා සිතුව ද? මං දානයට ආරාධනා කර තිබෙත්දී වෙන තැනකින් වැළඳුවේ ඇයි? හැකි නම් වළඳන්න. නැති නම් ගෙන යන්න යැයි පාත්‍රා පුරවමින් දානය බෙදුවේ ය. පසුව තමා කළ දෙයින් බොහෝ පවු සිදු වූවා ද? නැති නම් බොහෝ පින් සිදු වුනා දැයි සිතී, භාග්‍යවතුන් වහන්සේගෙන් ඇසූ විට යම් වෙලාවක ඔබ දානයට ආරාධනා කළා ද, එතැන් සිට බොහෝ කුසල් කර ගන්නා ලදි. සුගතිය පිණිස කටයුතු කරන ලදැයි භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

## සුප්පියා උපාසිකාවගේ මාංශ දානය - (මහා වග්ග පාළි භෙසජ්ජ කන්ධකය)

පදුමුත්තර බුදු රජාණන් වහන්සේ ළඟ දන් දී, මතු බුදු සසුනක ගිලන් ස්වාමීන් වහන්සේලාට උපස්ථාන කරන්නා වූ උපාසිකාවන් අතර අග්‍ර වෙම්වා යැයි ප්‍රාර්ථනා කර කල්ප ලක්ෂයක් සසර ගෙවා පැමිණ අපේ බුදු රජාණන් වහන්සේගෙන් ධර්මය අසා සෝතාපන්න ආර්‍ය ශ්‍රාවිකාවක් විය.

දිනක් විහාරස්ථානයට ගොස් ස්වාමීන් වහන්සේලාගේ සුව දුක් සොයා බලමින් එක් විරේක බෙහෙතක් වැළඳූ ස්වාමීන් වහන්සේ නමකට අවශ්‍ය මොනවා දැයි විමසූ විට මස් හොද්දක් තිබුණොත් හොඳ යැයි පැවසූ විට, එවන බවට පොරොන්දු වී නිවසට ගොස් මස් ගෙන ඒමට දාසිය වෙළඳ පොළට යැව්වා ය. විකිණීමට තිබූ මස් අවසන්ව ඇති බැවින් හිස් අතින් පැමිණ ඒ බව දැන්වූවා ය.

සෝතාපන්න ආයසී ශ්‍රාවකයන්ට ලෝකෝත්තර මාර්ගයෙන් පඤ්ච ශීලය ස්ථිර වේ. ජීවිතය නිසාවත් කඩ නොකරති. මස් හොද්දක් එවන බවට පොරොන්දු වූවා ය. පොරොන්දුව කඩ කළ නොහැක. විකිණීමට මස් නැති බැවින් සතෙක් මැරීම හෝ මැරවීම කෙසේවත් කළ නොහැක. ඇය තනිවම තීරණයක් ගත්තා ය. තම කලවයෙන් මස් කොටසක් කපා දාසියට දී සකස් කර, ගිලන් ස්වාමීන් වහන්සේට යැව්වා ය.

ඇය කකුල වෙලාගෙන කාමරයට වී නිදි යහනේ හුන්නා ය. සැමියා පැමිණ, කරුනු විමසා දැනගෙන තම බිරිඳගේ පරිත්‍යාගය ගැන පුදුම වී බුදු රජාණන් වහන්සේ වෙත ගොස් ඒ ගැන දැන්වීය. බුදු රජාණන් වහ්නසේ සුප්පියාවගේ නිවසට වැඩම කළ පසු, පාදයේ වේදනාවෙන් වැතිරී සිටි ඇය වත්තන් කරගෙන පැමිණි අතර, බුදු රජාණන් වහන්සේගේ දැකීමත් සමඟම කැපුම් තුවාලය ගොඩ වී සම්පූර්ණ සුවය ලැබුවා ය. අවස්ථාවට සුදුසු පරිදි ධර්මානුශාසනාවක් කර, විරාරස්ථානයට වැඩම කොට සඟ පිරිස රැස් කර, කරුනු විමසා එම ගිලන් භික්ෂුව වළඳ ඇත්තේ මිනිස් මාංශය බවත්, ඇතැම් සද්ධාවන්ත අය තම ශරීර මාංශය පවා පරිත්‍යාග කරන බැවින් තමාට ලැබුණ පිසින ලද මාංශ ව්‍යඤ්ජන කුමන වර්ගයක් දැයි විමසා වළඳන ලෙසත්, නොවිමසා වැළදීම වරදක් බව වදාළා මිස කර්මයේ ස්වභාවය නිවැරදිව දන්නා වූ භාග්‍යවතුන් වහන්සේ මංශ ආහාරය නොවැළඳිය යුතු යැයි වදාළේ නැත.

**"න භිකඛවෙ අපපටිවෙකඛිතවා මංසං පරිභඤ්ජි තබ්බං යො පරිභුඤ්ජෙප ආපතති දුකකටසස..."** (මහණෙනි, නොදන්නා වූ මස් වර්ගයක් ලැබුණහොත් නොවිමසා නොවැළඳිය යුතු ය. නොවිමසා වළඳන්නනේ නම් වරදකි.)

## තෙරුවන් සරණ ගිය නිගණ්ඨ ශ්‍රාවකයාගේ දනය

තථාගතයන් වහන්සේ විසල් පුර වැඩ සිටින කාලයක, රැස්වීම් ශාලාවෙහි රැස් වූ ප්‍රසිද්ධ වූ ලිච්ඡවීහු ත්‍රිවිධ රත්නයෙහි ගුණ කියමින් සිටියෝ ය. එම පිරිසෙහි සිටි නිගණ්ඨ ශ්‍රාවක සිංහ සේනාපතිතුමාට

බුදු රජාණන් වහන්සේ හමුවීමට යාමේ අදහසක් ඇති වී, ඒ බව නිගණ්ඨ නාථ පුත්ත නම් වූ අන්‍යාගමික නායකයාට දැනුම් දුන් අතර, ඔහු විසින් ගමනට බාධා කළේ ය. මෙසේ දෙවතාවක් ම බාධා කළ පසු තුන් වෙනි වර නිගණ්ඨ නාථ පුත්තට නොදන්වා ම ගියේ ය.

අන්‍යාගමික කෙනෙක් වුවත් ඒ ආගම දෘෂ්ඨියක් කර නොගත් නිසා බුදු රජාණන් වහන්සේට වන්දනා කර, පැත්තකින් වාඩි වී තමාට අසන්න ලැබුණ කරුනක් ඉදිරිපත් කළේ ය. ඔබ වහන්සේ අකිරිය වාදියෙක්ලු, නොකිරීම පිණිස ධර්ම දේශනා කරනවාලු, ඒ අයුරින් ම ශ්‍රාවකයන් පුහුණු කරනවාලු, මේ කථාව ඇත්තක් ද? ඔබ වහන්සේට බොරු චෝදනා කරන්න මම කැමති නොවෙමි.

සීහය, කාය දුසිරිත්, වචනයෙන් දුසිරිත්, සිතෙන් දුසිරිත් නොකළ යුතු බව මම කියමි. නොයෙක් අකුසල ධර්ම නොකිරීම පිණිස ධර්ම දේශනා කරමි.

එමෙන් කායික, වාචසික හා සිතින් සුසිරිත් හි හැසිරීම, නොයෙක් ආකාර කුසල් කිරීම පිණිස ධර්ම දේශනා කරමි.

සීහය, එපමණක් නොව රාගය, තරහ, මුලාව හා නොයෙක් අකුසල් නැති කිරීම පිණිස ද ධර්ම දේශනා කරමි. කායික වූ ද, මානසික වූ ද, වාචසික වූ ද, දුසිරිත් හා අකුසල් පිළිකුල් කරමින්, ඒවා පිළිකුල් කිරීම පිණිස ධර්ම දේශනා කරමි.

රාග, ද්වේශ, මෝහ අකුසල් නැති කිරීම පිණිස ද, ධර්ම දේශනා කරමි. කායික වූ ද, මානසික වූ ද, වාචසික වූ ද දුසිරිත් හා අකුසල් පිළිකුල් කරමින් ඒවා පිළිකුල් කිරීම පිණිස ධර්ම දේශනා කරමි.

මම නැවත මව් කුසෙහි නොවසන කෙනෙක් බවට පත් වී නැවත මවු කුසෙහි නොවැසීම පිණිස ධර්ම දේශනා කරමි.

මෙසේ කරුණු කියා දුන් පසු බුදු රජාණන් වහන්සේත්, ධර්ම රත්නයත්, සංඝ රත්නයත් සරණ යන බව සිංහ සේනාපතිතුමා ප්‍රකාශ කළේ ය.

අනතුරුව සිංහය, ඔබ වැනි ප්‍රසිද්ධ කෙනෙක් හොඳට සිතා බලා, කටයුතු කළ යුතු බවත්, තෙරුවන් සරණ ගියත්, පෙර මෙන් නිගණ්ඨයන්ට සත්කාර කළ යුතු බව බුදු රජාණන් වහන්සේ විසින් දැනුම් දී, දාන, ශීල, පිළිබඳව ද, එහි විපාක වූ සුගති සැප පිළිබඳව ද, කාමයන්ගේ ඇති ලාමක ස්වභාවය ද, කෙළෙසෙන බව ද, කාමයන් අතහැරීමේ ඇති ආනිශංසය ද, දුකත්, දුකට හේතුවත්, දුක නැතිවීමත්, දුක නැති කරන මගත් යන සතර සත්‍ය වදාළ පසු, සදහටම පස් පවින් හා සතර අපායෙන් මිදී, ස්ථිර පඤ්ච ශීලයෙහි පිහිටා සෝතාපන්න ආර්‍ය්‍ය ශ්‍රාවකයෙක් වී, පසු දිනට දානයට ආරාධනා කර ගොස්, විකිණීමට ඇති මාංශ ගෙන්වා ගෙන දානය සූදානම් කරවීය.

මේ සියලු විස්තර දැනගත් නිගණ්ඨ පිරිස තම ශ්‍රාවකයෙකු අහිමිවීම දරාගත නොහැකිව, මසුරුකමින්, ඉරිසියාවෙන්, කෝපයෙන් මැඩී, අද සිංහ සේනාපතියා ලොකු ගවයෙක් මරා දානයක් දෙනවා. තමන් උදෙසා මරන ලද සත්ව මාංශය ශ්‍රමණ ගෞතමයන් වහන්සේ ඒ බව දැන දැන ම වළඳන්නේ යැයි නුවර වීදියක් පාසා ඇවිදිමින්, ඝෝෂා කළෝ ය. යම්කිසි පුරුෂයෙක් පැමිණ, ඒ බව සිංහ සෙන්පතිතුමාට දැන්වී ය.

ඔය නිගණ්ඨයෝ බොහෝ කලක පටන් තුනුරුවන්ගේ අගුණම කියන්නෝ ය. භාග්‍යවතුන් වහන්සේට බොරුවෙන් චෝදනා කරන්නෝ ය. මම මාගේ ජීවිතය නිසාවත් දැන දැන සතෙකු නොමරමි යැයි කියා සිංහ සේනාපතිතුමා විසින් ප්‍රණීත දානය පිළිගන්වන ලදි. දන් වළඳා අවසන්ව, අනුමෝදනා කර, විහාරස්ථානයට වැඩම කළ භාග්‍යවතුන් වහන්සේ සඟ පිරිස රැස් කර, මෙසේ වදාළ සේක.

**න භික්ඛවෙ ජානං උද්දිස්ස කටං මංසං පරිභුඤ්ජිතබ්බං. යො පරිභුඤ්ජෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවේ තිකොටිකං පාරිසුද්ධං මච්ඡමංසං අදිට්ඨං අසුතං අපරිසඞ්කිතං.**

මහණෙනි, දැන දැන තමන් උදෙසා මරණ ලද සත්ව මාංශ නොවැළඳිය යුතු ය. වළඳන්නේ නම් වරදක් වේ. මහණෙනි, තමා වෙනුවෙන් මරණ ලද බවත්, නොදුටු, නොඇසූ, සැක නොසිතූ යන කරුනු තුනෙන් පිරිසිදු වූ මාංශය වැළඳීමට අවසර දෙමි.

# තේලෝවාද (බාලෝවාද) ජාතකය

ගෝල පිරිස සමඟ නිගණ්ඨනාථ පුත්ත විසින් බුදු රජාණන් වහන්සේට බොරුවෙන් චෝදනා කෙරේ යැයි ධර්ම සභාවෙහි භික්ෂූන් වහන්සේලා සාකච්ඡා කරමින් හිඳින තැනට වැඩම කළ බුදු රජාණන් වහන්සේ විසින් ඔය නාථ පුත්ත නිගණ්ඨයා මට බොරුවෙන් චෝදනා කෙළේ දැන් පමණක් නොවේ. මීට පෙරත් බොරු චෝදනා කළේ යැයි වදරා, අතීත සිද්ධියක් දේශනා කළ සේක.

අතීත භවයක බෝධිසත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයෙහි ඉපිද, තාපස කෙනෙක්ව පැවිදි වී, හිමාලයෙහි වාසය කර, ලුණු ඇඹුල් සහිත ආහාර ලබා ගැනීම සඳහා බරණැස් නුවරට පැමිණි විට, එක්තරා කෙළෙඹියෙක් (දරු පවුල් රකින්නෙක්) තාපසතුමාට චෝදනා කරනු කැමතිව මස්, මාළු සහිත ආහාර දී, අනුභව කළ පසු,

**හනත්වා ඣත්වා වධිත්වාච - දෙති දනං අසඤ්ඤතො**
**එදිසං භත්තං භුඤ්ජමානො - සපාපෙන උපලිම්පති.**

යම් දුස්ශීලයෙක් සතෙකුට පහර දී, පීඩා කර, මරා, දනයක් දෙයි ද, එබඳු දනය අනුභව කරන කෙනාට ද එම පාපයෙන් කොටසක් අයත් වන්නේ ය. මේ මාංශය ඔබතුමා වෙනුවෙන් මරා, උයා දෙන ලදි. එබැවින් ඔබටත් පවක් වේ යැයි ඔහු කී ය.

**පුත්ත දරම්පි හනත්වා - දෙති දනං අසඤ්ඤතො**
**භුඤ්ජමානොපි සප්පඤ්ඤො - න පාපමූපලිම්පති.**

ඉතින් දුස්ශීලයෙකු විසින් තම අඹු දරුවන් මරා හෝ දන් දේ ද, ඉවසීම, මෛත්‍රිය, ශීලාදී ගුණයෙන් යුතු ප්‍රඥාවන්තයා එම දනය වැළඳීමෙන් ඔහුට පවක් නැතැයි ධර්මානුකූලව පෙන්වා දී, බෝධිසත්ව තාපසතුමා නැගිට ගියේ යැයි බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## පණීත භෝජන ශික්ෂා පදය
## (විනය පිටකය - පාචිත්ති පාළියෙහි භෝජන වර්ගය)

බුදු රජාණන් වහන්සේ වැඩ සිටි කාලයෙහි මෙත්තිය, භුම්මජක, අස්සජී, පුනබ්බුසුබ, ලෝහිතක, පණ්ඩුක යැයි ස්වාමීන් වහන්සේලා සය නමක් විහාරස්ථාන තුනක වාසය කළ අතර, බුදු සසුනෙහි බොහෝ අර්බුද ඇති කළෝ ය. සික පද බොහෝ ගණනක් පැනවීමට මේ සය නම මුල් වූහ. එබැවින් පොදු සම්මත ව්‍යවහාරයෙන් ජබ්බග්ගිය නමින් හඳුන්වන ලදි.

මේ ස්වාමීන් වහන්සේලා ගිහි අයගෙන් තෙල්, ගිතෙල් ආදී ප්‍රණීත භෝජන ඉල්ලමින් වැළඳූහ. එබැවින් මේ සික පදය පනවන ලදි. තමාගේ ඥාතීන්ගෙන් හා ඔබ වහන්සේලාට අවශ්‍ය මොනවද ඒ අවශ්‍ය දේ කියන්න යැයි පැවරූ අයගෙන් කප්පියකාර අයගෙන ඉල්ලා ගැනීම වරදක් නොවේ.

**යානි කොපන තානි පණීත භොජනානි සෙය්‍යථීදං සප්පි නවනීතං තෙලං මධු පාණිතං මචේඡා මංසං ඛීරං දදි යොපන භික්ඛු එවරූපානි පණීත භොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජෙය්‍ය පාචිත්තියං**

යම් ඒ ප්‍රණීත භෝජනයක් වෙත් ද, ඒ කවරේ ද? ගිතෙල්, බටර්, තෙල්, මී පැණි, හකුරු, මස්, මාළු, දියර කිරි, මිදුන කිරි යම් භික්ෂුවක් නොගිලන්ව එබඳු වූ ප්‍රණීත භෝජන ඉල්ලාගෙන වළඳයි නම් පචිති ආපත්ති වේ.

## සූකර මාංශය වැළඳීම

දීඝ, මජ්ඣිම නිකායන්හි ඇතැම් සූත්‍රවල චුල්ල ශීල, මජ්ඣිම ශීල, මහා ශීල වශයෙන් ශීලය විස්තර වන තැන් හී **ආමක මංස පටිග්ගහනා පටිවිරතො හොති......** නොපිසිනා ලද අමු මාංශය සිල්වත් භික්ෂුව පිළිගැනීමෙන් වැළකුණේ වේ යැයි වදාරා ඇත.

එක්තරා භික්ෂුවකට අමනුෂ්‍ය ආබාධයක් විය. කළ යුතු නොයෙක් ප්‍රතිකාර කළත් සුව නොවීය. දිනක් ඌරන් මරණ තැනකට ගොස් අමු ඌරු ලේ සහ මස් අනුභව කිරීමෙන් සුව විය. (භික්ෂුව හරහා අමනුෂ්‍යයා ඒවා භුක්ති වින්දේ ය.) මේ කරුණ බුදු රජාණන් වහන්සේට දැන් වූ පසු,

**අනුජානාමි භික්ඛවෙ අමනුස්සිකා බාදෙ ආමක මංසං ආමක ලොහිතං.....** මහණෙනි, අමනුෂ්‍ය ආබාධයකදී අමු මස්, අමු ලේ පරිභෝගයට අවසර දෙමි යැයි වදාළ සේක. (මහාවග්ග පාළි භේසජ්ජ ඛන්ධකය)

## තහනම් කළ මාංශ ආහාර

එක් කාලයක දුර්භික්ෂයක් ඇති විය. එම කාලයෙහි ජීවත්වීමේ අපහසුතාවය නිසා මනුෂ්‍යයෝ මැරෙන ඇතුන්, අශ්වයන්ගේ සහ සිංහ, කොටි, ව්‍යාඝ්‍ර, වළස්, සුනඛ හා සර්ප මංශ අනුභව කළෝ ය පිඬු සිඟා වඩින ස්වාමීන් වහන්සේලාට ද පූජා කළෝ ය.

නුවණැති මනුෂ්‍යයෝ දෙස් කීහ. ඇත් හා අශ්වයා රජුගේ වාහනය යි. භික්ෂූන් එම සතුන්ගේ මාංශ වළඳන බව රජු දැනගත්තොත් සතුටු නොවේ. සුනඛ සහ සර්ප මස් පිළිකුල් ය. සුඵස්ස නම් නාග රාජයාද පැමිණ භාග්‍යවතුන් වහන්ස, ඉතා සැර පරුෂ වූ නාගයෝ ඇත. භික්ෂූන් වහන්සේලා සර්ප මාංශ වළඳන බව දැන ගත් විට හිරි හැර පීඩා කරනු ඇත. එම නිසා සර්ප මාංශ නොවළඳන්නාහු නම් හොඳ යැයි ආරාධනා කළේ ය.

දඩයම්කරුවෝ සිංහ, කොටි, ආදී සතුන් මරා මස් අනුභව කරති භික්ෂූන්ට ද දනයට දෙති. ඒවා වළඳ වනයේ වාසය කළ භික්ෂූන් ළඟ මාංශ ගන්ධය දැනී සිංහ කොටි ආදී සතුන් භික්ෂූන්ට පහර දෙන ලදුව ඇතැම් භික්ෂූහු අපවත් වූහ. මේ කරුනු මුල් කරගෙන ඇතුන්ගේ, අශ්වයන්ගේ, සිංහයන්ගේ, කොටින්ගේ, ව්‍යාඝ්‍රයන්ගේ, වලසුන්ගේ, කළු හිස් වළසුන්ගේ, සුනඛයන්ගේ හා සර්පයන්ගේ මාංශ නොවැළඳිය යුතු ය. වළඳන්නේ නම් වරදක් වේ යැයි බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## බ්‍රාහමණ ධම්මික සූත්‍රය - (සූත්‍ර නිපාතය)

භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර සමීපයෙහි ජේතවනාරාමයෙහි වැඩ වාසය කරන සමයක බොහෝ වයස ඉක්මවූ බ්‍රාහ්මණ පිරිසක් පැමිණ භාග්‍යවතුන් වහන්සේ සමඟ තොරතුරු කථා කර, පසෙකින් වාඩි වී, මෙබඳු ප්‍රශ්නයක් ඇසූහ.

පින්වත් ගෞතමයන් වහන්ස, දැන් සිටින බ්‍රාහ්මණයන් තුළ පැරණි බ්‍රාහ්මණ ධර්ම පවතිනවාද? බ්‍රාහ්මණවරුනි, පැරණි බ්‍රාහ්මණ ධර්ම දැන් සිටින බ්‍රාහ්මණයන් ලඟ නොපවතී. පින්වත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේට බරක් නොවේ නම් අපට පැරණි බ්‍රාහ්මණ ධර්ම කියා දෙන සේක්වා. එසේ නම් බ්‍රාහ්මණවරුනි, හොඳින් අහන්න. මෙනෙහි කරන්න. කියා දෙන්නම්.

පෙර විසූ බ්‍රාහ්මණවරු ශීලයෙන්, ඉන්ද්‍රිය සංවරයෙන් යුතුව පඤ්ච කාම සම්පත් අතහැර තමාගේ උත්තමාර්ථය පිළිබඳව කටයුතු කළෝ ය.

ඔවුහු එළු, බැටළු, ගව ආදී සතුන් ඇති නොකළෝ ය. මිල, මුදල් ධාන්‍ය ආදිය රැස් නොකළෝ ය. ඔවුන්ගේ ධනය වූයේ ඉගෙන ගත් දෙය සජ්ඣායනා කිරීම යි.

අනුන්ගේ ගෙවල්වලින් උයන ලද ආහාර ලබාගෙන ජීවත් වූහ. ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ගෙවල් ආදියෙන් ගම් ජනපද, රටවල් සමෘද්ධිමත් වූහ. එහි වැසියෝ උදේ සවස බ්‍රාහ්මණයින්ට නමස්කාර කළෝ ය. වසර හතළිස් අටක් කුමාර බ්‍රහ්ම චරියාව රැක්කෝ ය. පඤ්ච ශීලය රැක්කෝ ය. එබැවින් සියල්ලෝ ම විශ්වාස කරමින් ඕනෑම නිවසකට යෑම නොවැළැක්වූහ.

වසර හතළිස් අටෙන් පසු ආවාහ කරගෙන තම බිරිඳ හැර වෙනත් අඹුවන් කරා නොගියෝ ය. දරුවන් ලබා ගැනීම පිණිස ඔසප් කාලයට පමණක් එක් වූහ. බ්‍රහ්ම චරියාවත්, ශීලයත් අවංක බවත්, මෘදු ගුණයත්, තපස ද, පිළිකුල් නොවන පැවතුම් ද, අවිහිංසාව ද, ඉවසීම ද වර්ණනා කළෝ ය. එම බ්‍රාහ්මණයන් අතර, යම් කෙනෙක්

ඉතා උසස් ලෙස බ්‍රාහ්මණ ධර්ම පිරුවෝ ද ඒ අය සිහිනෙන්වත් මෛථුනයෙහි නොයෙදුනෝ ය.

ඒ පැරණි බ්‍රාහ්මණයන්ට අනුව යන ඇතැම් නුවණැති අය සහල්, වස්ත්‍ර, සයනාසන, තෙල්, ගිතෙල් ධාර්මිකව ලබා ගෙන දන් දුන්නෝ ය. (යාග පැවැත් වූහ.) ඒ සඳහා ගවයන් නොමැරූහ.

තම මව්පිය, සහෝදර, ඥාතීහුවෙත් ද, පස් ගෝ රස ලබා දෙන ගවයෝ ද එසේ සැලකූහ. තම මිතුරන් සේ ගවයන්ට සත්කාර කළහ. පස්ගෝ රස නිසා ආහාර, බලය, වර්ණය, සැපය ලැබෙන බැවින් ගවයන් නොමැරූහ.

කල් ගතවන විට සිත් විපරීත බවට පත්ව පස්කම් සුව විඳින අය දෙස බලා ඒවා ලබා ගෙන සැප විඳීමට සිතූ බමුණෝ වැරදි ලෙස මන්ත්‍ර ගොතා ඔක්කාක රජු වෙත ගොස් සතුන් මරා යාග පැවැත්වීමට කරුනු කියා දුන්හ. බමුණන්ගේ කීමට යාග පවත්වා බමුණන්ට වස්තුව දෙන ලදි. පස්ගෝරස අනුභව කළ පසු කිරි, ගිතෙල් මෙතරම් රස නම් ගවයන්ගේ මස් කොතරම් රසවත් දැයි සිතූ බමුණෝ නැවත මන්ත්‍ර ගොතාගෙන ගොස්, මේ ගවයෝ මනුෂ්‍යයන්ගේ ප්‍රයෝජනය සඳහා උපන්නෝ ය. එබැවින් ඔවුන් මැරුවාට පවක් නැත. ගවයන් මරා යාග පැවැත්වීමෙන් බ්‍රහ්ම ලෝකයට යා හැකි යැයි බොරු කීහ.

අනතුරුව සිය දහස් ගණන් ගවයන් මරා, යාග පැවැත් වූහ. මිනිසුන් අතර අධර්මය පැතිරුණේ යැයි දෙවියෝ කොලාහල කළහ. බඹ ලොව දක්වාම මෙම ආරංචිය පැතිර ගොස් දෙවියෝ බ්‍රහ්මයෝ නින්දා කරමින් මිනිසුන් පිළිකුල් කළෝ ය. එපමණක් නොවේ.

**තයො රොගා පුරෙ ආසුං - ඉච්ඡා අනසනං ජරා**
**පසූනඤ්ච සමාරම්භා - අට්ඨානවුති මාගමුං**

ආශාවත්, කුස ගින්නත්, මහලු බව යන රෝග තුන පමණක් මිනිසුන්ට ඇති වූ අතර ගවයන් මැරීම ආරම්භ කළ තැන් පටන් අනූ අටක් රෝග ඇති විය. අං තිබුණත් කිසිවෙකුට හිංසාවක් නොකළ,

පොළොවෙහි තණ උලා කා, ජීවත් වන ගවයන් මැරීම නම් වූ අධර්මය ලොව පැතිරුණේ ය.

පුරාණ බ්‍රාහ්මණ ධර්මය මෙසේ නැති වීම නිසා, පෙර සමගිව සිටි මනුෂ්‍යයෝ භේද භින්න වූහ. භාර්‍යාවෝ තම ස්වාමිවරු ඉක්මවා, මැඩගෙන කටුයතු කළෝ ය. ඛත්තිය, බ්‍රාහ්මණ, වෙස්ස, ශූද්‍ර භේද නැතිව ආවාහ විවාහ වශයෙන් මිශ්‍ර වූහ. මෙසේ මිනිස් ප්‍රජාවම කාමයන්ගේ වසඟයට පත් වූහ යැයි වදාළ පසු එම මහලු බමුණු පිරිස දේශනාවට සතුටුව තෙරුවන් සරණ ගොස් බෞද්ධ බව ප්‍රකාශ කළහ.

## මෙත් වඩන්නේ කාටද ?

**සුඛිනොවා ඛෙමිනො හොන්ති - සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා**
(සියලු සත්වයෝ කයින් සුවපත් වෙත්වා. සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා)
**යෙකෙචි පාණ භූතත්ථි තසාවා ථාවරාවා අනවසෙසා දීඝාවා යෙ මහන්තාවා - මජ්ඣිමාරස්සක අනුකථූලා දිට්ඨාවායෙව අද්දිට්ඨා යෙච දූරෙ වසන්ති අවිදුරෙ භූතා වා සම්භවෙසීවා සබ්බෙ සත්තා භවන්තු සුඛිතත්තා.**

යම් කිසි උපන් සත්වයෝ වේද, කෙළෙස් නිසා තැති ගත් සත්වයෝ ද, කෙළෙස් නැති බැවින් ස්ථිර නිර්භය බවට පත් වූ අය ද, ඉතිරිවක් නැතිව දික් වූ හෝ මහත් වූ හෝ මධ්‍යම ප්‍රමාණ ඇති හෝ කෙටි සිරුරු ඇති ඉතා කුඩා හෝ රවුම් හැඩ ඇති හෝ පෙනෙන හෝ නොපෙනෙන හෝ දුර හෝ ළඟ හෝ වසන්නා වූ ද, උපන්නා වූ ද, නූපන්නා වූ හෝ උපදින හෝ සතුන් වේ ද ඒ සියලු සත්වයෝ සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා.

මෙසේ පණ ඇති ජීවත්වන සියලු සත්වයන්ට මෙත් වැඩිය යුතු බව කරණීයමත්ථ සූත්‍රයෙන් දේශනා කළ සේක.

එක් භික්ෂුවකට සමාධි භාවනා හොඳට පුරුදු ය. මෛත්‍රී භාවනාව කොතෙක් කළත් ධ්‍යාන නූපදී. කර්මස්ථානාචාරීන් වහන්සේට දැන් වූ පසු මෛත්‍රී කරන කෙනා ජීවත්ව සිටී දැයි විමසුවේ ය. විමසා

බලන විට මෛත්‍රී වඩන ලද්දේ අපවත් වූ උපාධ්‍යායන් වහන්සේට ය. පසුව ජීවත් වන කෙනෙක් අරමුණු කර මෙත් වැඩූ පසු ධ්‍යාන ලැබී ය. (විසුද්ධි මාර්ගය)

එබැවින් මෛත්‍රී කළ යුත්තේ ජීවත් වන සත්වයන්ට මිස මැරුණ සත්වයන්ට නොවේ. මැරුණ සත්වයා මළ සිරුර තුළ නැත. ඒ වන විට කර්මයට අනුව වෙනත් තැනක ඉපදී අවසන් ය. කෙනෙක් මැරුණු සතෙකුගේ කොටස් අනුභව කෙරේ නම් ඔහු අනුභව කරන්නේ දිරා යන සතර ධාතූන්ගෙන් යුතු රූප කොටස් ය.

මැරුණු සතෙකුගේ රූප කොටස් අනුභව කරන්නෙකුට ඇති වන්නේ පස් පවින් කුමන පව ද? දස අකුසලින් කුමන අකුසලය ද? ලෝභය ඇති වේ යැයි යමෙක් කියයි නම් පෘතග්ජන සත්වයාට ලෝභයෙන් තොරව අනුභව කළ හැකි දෙයක් නැත. ලෝභය අකුසල ධර්මයක් මිස පාපයක් නොවේ.

ප්‍රාණඝාත හෙවත් සතුන් මැරීමේ අකුසල කර්මය සිදු වීමට කරුණු පහක් එකතු විය යුතු යි. පණ ඇති සතෙකු වීම. පණ ඇති සතෙක් බව දැන ගැනීම. මරණ චේතනාව, මැරීමට උපක්‍රම කිරීම, එයින් මරණයට පත්වීම. සතෙකු මැරී හෝ මරා වසර ගණනක් වියළි සිරුරු කොටස් නොනැසී කරවල වශයෙන් තිබී වෙනත් අයෙක් ඒ රූප කොටස් අනුභව කරන විට එහි සතෙක් සිටී ද? සතෙකැයි සිතයි ද? මරණ චේතනාව ඇතිවේ ද? මරන්න උපක්‍රම කරයි ද? කරවලයා මැරේ ද? දැන් ඔහුට ඇති වූ අකුසල කර්මය කුමක් ද?

## මස්, මාළු නොකන්නෝ

මෘදු සිත් ඇත්තන්ට මරන්න සිටින හෝ මරණ සත්වයන් දුක් විඳින හැටි දැක අනුකම්පාව ඇති වී නොකති. පිළිකුළ නිසා ඇතැමෙක් නොකති. යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් කරන්නෝ යකුන්ට භයේ නොකති. මස්, මාළු කෑම පාපයක් යන මිත්‍යා දිට්ඨිය නිසා නොකති. ඇතැම් අය කුහකකම නිසා අනුන් පැහැදවීමට ව්‍රතයක් ලෙස නොකති. මේ කොයි ආකාරයෙන් නොකෑවත් එය ශීලයක් ලෙස සිතා ගතහොත් මිත්‍යා දිට්ඨියක් බවට පත් වේ. මෙවැනි මිස දිටු අය දහස් ගණනින් ලක්ෂ

ගණනින් වියදම් කරමින් සැතපුම් සිය ගණන් දුර නිර්මාංශ ආහාර වළඳන ස්වාමීන් වහන්සේලා උග්‍ර ශීලවන්ත උතුමෝ යැයි සිතා දන් දීමට යන අතර, මාංශාහාර නිවැරදි බෝජනයක් ලෙස වළඳන භික්ෂූන් කෙරෙහි අපහදිති. මෙසේ මස් මාළු නොවැළඳීම මිසදිටු අයගෙන් බොහෝ පුද පූජා, ලාභ සත්කාර ලබා ගැනීමට ඇති හොඳම මගක් වේ.

මැරුණ සතුන්ගේ සිරුර කොටස් කෑම පවක් යැයි සිතන ඇතැම් අය වස විස යොදා දහස් ගණන් ලක්‍ෂ ගණන් සතුන් මරමින් බොහෝ පවු රැස් කර ගනිති.

මැරී වසර ගණන් ගත වී, වියැලුණු හාල් මැසි රොඩුවලට මෛත්‍රී කරන බොහෝ මෛත්‍රීවාදීහු තම සේවකයන්ට එම මෛත්‍රිය නොදක්වති. එබඳු ව්‍යාපාරිකයෝ පාරිභෝගික වූ තම ආර්ථිකයට, අභිවෘද්ධියට ආධාර කරන මිනිසුන්ට එම මෛත්‍රිය නොදක්වති. එබඳු ඇතැම් යතිවරයෝ තමාට ගැතිකම් නොකරන අයට ස්වල්ප මාත්‍ර මෛත්‍රියක් නොකරති.

මළ කුණුවලට මෛත්‍රී කරමින්, මළ කුණුවලට මෛත්‍රී කරන අය සොයා සැතපුම් දහස් ගණන් දුර දන් දෙන්න යන විට තමන් ඉදිරියට පැමිණ අත පාන යදියන්ට, දුගියන්ට මෛත්‍රී නොකරති. මේ බොහෝ අරුම පුදුම මිනිස් සතුන්ගේ අරුම පුදුම මෛත්‍රියේ සහ ශීලයේ ස්වභාවයෙන් බිඳකි. සත්ව මාංශ අනුභව කරමින් මෛත්‍රී භාවනා කළ හැකි දැයි ඇතැම් අය ප්‍රශ්න කරති. නොකළ හැකි දැයි ඇතැම් අය පිළිතුරු දෙති. එසේ නම් වියළි කරවල, කුණු මස්, මාළුවලට මහා මෛත්‍රිය පතුරමින් දේපළ ලියා නොදෙන මව්පියන්ටත්, ඉඩම් බෙදා ගත නොහැකිව බදාගෙන සහෝදර සහෝදරියන්ට බිම් අඟලටත් සිත් රිදෙන වචනයක් කී පමණින්, අසල්වාසීන්ටත් තමා කරන ව්‍යාපාරයම වෙනත් කෙනෙක් අරඹන විටත්, තමන්ට දන් දෙන අය වෙන අයට දන් දෙන විටත්, තමාට අයිති යැයි සිතා සිටින ගොදුරු ගමේ වෙනත් පුදබිමක් සදන විටත්, තමාට සමාන නොවූ බැවින් වෙනත් ජාතියකටත් වෛර කළ හැකි ද? මේ අපේ පැණය යි. පිළිතුර ඔබ සතු ය.

# පච්චත්තං වෙදිතබ්බෝ විඤ්ඤූහි

ත්‍රිපිටකයෙන් සූත්‍ර, විනය, පෙළ අටුවාවන්ට අනුව සම්බුද්ධ ශ්‍රී මුඛ දේශනාවන්ට අනුව හා ජන සමාජයේ සිත් තුළින් නිකුත් වෙන අදහස් ඉදිරිපත් කර ඇත. බුදු රජාණන් වහන්සේගේ සියල්ල දක්නා වූ සර්වඥතා ඥානයට හා තර්කයෙන් අවබෝධ කළ නොහැකි අතක්කාවචර දහමට අභියෝග නොකර, හළ යුතු දේ අතහරිහමින්, ගත යුතු දේ ගැනීමට පාඨක ඔබට හොඳ නුවණ ම පහළ වේවා.

සුප්පියා උපාසිකාව මස් රසය යවන ලද්දේ විරේක බෙහෙත් වැළඳූ භික්ෂුවකට ය. මංස ජාතකය දේශනා කිරීමට මුල් වූ සිද්ධියේ දී සැරියුත් මහ රහතන් වහන්සේ විසින් මස් රස භෝජනය ලබා දෙන ලද්දේ විරේක බෙහෙතක් වැළඳූ පසු සිදු වෙන දෙය කවුරුත් දන්නා කරුණකි. කුසෙහි ඇති සියලු ආහාර ඉවත් ව කුස හිස් වේ. එවිට අධික කුස ගින්නක්, පිපාසයක් දැනේ. සිරුරේ ශක්තිය අඩු වේ.

ලෝහිත පක්කන්දිකාව සැදුන බුදු රජාණන් වහන්සේට ද ඇති වූ තත්වය එසේම යි. අතීත දිවියක වෙදෙකුව රෝගියෙකුට අධිකව විරේක වන ලෙස බෙහෙත් දී එයින් ම ඔහු මළේ ය. මෙම අකුසල කර්මය භවයෙන් භවය පසු පස පැමිණ අපරාපරිය කර්ම වශයෙන් බුදු වූ අන්තිම දිවියේ අවසානයට ඉඩ ලැබී රෝගාතුරව දුර්වලව සිටි අවස්ථාවෙහි චුන්ද විසින් ඉන්දීය සමාජයෙහි භාවිත කරන ලද දෙයක් වූ ඌරු මාංශය රසායන ක්‍රමයට සාදා දෙන ලද බව ඉහත කථාවලින් මනාව සවිර වේ.

ආමගන්ධ සූත්‍රයේ කෙළින් ම බුදු රජාණන් වහන්සේ මංශාහාරය වැළඳූ බවත්, අනාගාමී වූ උග්ගතුමා ද, රහත් තෙරණියක් වූ උප්පල වණ්ණාව විසින් පූජා කළ බව පැහැදිලිව ඇත. කුරු කුහුඹුවන්ගේ පටන් සියලු ප්‍රාණීන්ට මෛත්‍රී කිරීමට ඉගැන්නුවා මිස මළ කුණුවලට, වේළුන සිරුර කොටස්වලට මෛත්‍රී කරන්න උගන්වා නැත.

සම්බුදු දහම මධ්‍යම ප්‍රතිපදාවක් මිස අන්තවාදී ආගමක් නොවේ. එදා නුවණ ඇති අය ජීවමාන බුදු රජාණන් වහන්සේට නිවැරදි වූ භෝජන පුදා, කුසල් රැස් කර ගත් අතර, පිරිනිවන් පා ලොවෙන්

එතෙර වූ, පූජා කළත් නොවළඳන බුදු රජාණන් වහන්සේ උදෙසා නිවැරදි භෝජනය පූජා කර මහා කුසලයක් අත් කර ගැනීමට ඇති කල්හී අන්තගාමී මිසදිටු අය එය වළක්වා අනුන්ගේ පිනට ද බාධා කරති.

අපට දැකගත නොහැකි, ගැඹුරු වූ කර්ම විශය බුදු නුවණට ම දැනෙන දෙයකි. එබැවින් බුදු නුවණින් දැන වදාළ දෙය සද්ධාවෙන් පිළිගනිමින් බුදු නුවණට අභියෝග නොකර අත්තනෝමතයට ගැති නොවී, මැදහත්ව කරුණු වටහා ගනිත්වා. ඒ සඳහා ඔබට සම්මා දිට්ඨිය පිහිටාවා.

## භෝජන සූත්‍රය
### (අංගුත්තර නිකාය - පඤ්චක නිපාතය)

මහණෙනි, ආහාරයක් දෙන කෙනා ලබන්නාට එම ආහාරයෙන් කරුනු පහක් දෙයි. එම කරුණු පහ මොනවාද? ආයුෂය දෙයි, වර්ණය දෙයි, සැපය දෙයි, බලය දෙයි, වැටහීම (නුවණ) දෙයි, ආයුෂ දී දෙව් මිනිස් අතර දීර්ඝ ආයුෂ ලබයි. වර්ණය දීම නිසා දෙව් මිනිසුන් අතර වර්ණය ලබයි. සැපය දී දෙව් මිනිසුන් අතර සැප ලබයි. බලය දී දිව්‍යමය වූ ද, මනුෂ්‍යමය වූ ද බලය ලබයි. නුවණ දී දෙව් මිනිසුන් අතර නුවණ ලබයි.

ඔබ බොහෝ කල් ජීවත්වනු කැමති නම්, පැහැපත් සිරුරක් ලබනු කැමති නම්, සැප ලැබීමට කැමති නම්, කාය ශක්තිය ලබනු කැමති නම්, චිත්ත ශක්තිය හෙවත් ඕනෑම දෙයක් වටහා ගැනීමේ නුවණ ලබනු කැමති නම්, තනියම නොකා කාට හෝ වේවා කෑම බීම දෙන්න. එය හේතුඵල දහමයි. හේතුව දීම යි. ඵලය ලැබීම යි. එය මෙලොව විය හැකි ය. පරලොව විය හැකි ය. මෙලොව නම් දිට්ඨ ධම්ම වේදනීය යි. මෙය හතෙන් එක් කොටසකි. පරලොව නම් උපපජ්ජ වේදනීය සහ අපරාපරිය වේදනීය වශයෙන් හතෙන් සය කොටසකි. මෙය පරම සත්‍ය බුද්ධ වචනය යි.

## කාලික දාන සූත්‍රය

(අංගුත්තර නිකාය - පඤ්චක නිපාතය)

මහණෙනි, කාලික දීමනා පහකි. එය කවරේ ද? ආගන්තුක අයට දන් දීම, ගමන් යන අයට දන් දීම, දුර්භික්ෂ කාලයට ආහාර පාන දීම, තමා උදෙසා වගා කරන ලද ධාන්‍ය, පළතුරු ආදියෙහි පළමු කොටස සිල්වතුන්ට දීම. ගිලනුන්ට දීම.

මසුරුකම දුරු කළ, ප්‍රඥාව ඇති අය, සුදුසු අවස්ථාවෙහි දන් දෙති. අවංක වූ ඉවසීමා දී ගුණ ඇති නිවැරදි දිවි පැවතුම් ඇති අය කෙරෙහි ප්‍රසන්න සිතින් දෙන දීමනාව මහත්ඵල ගෙන දෙයි.

එවැනි දානයක දී යම් අය අනුමෝදම් වෙත් ද, වතාවත් හෝ කරත් ද, දන් දෙන අයට අඩුවක් නොවේ. ඒ අයද පිනට කොටස්කාරයෝ වෙති. එබැවින් යම් තැනෙක යම් පිරිසකට දෙන දෙයට මහත් වූ පුණ්‍ය ඵල ගෙන දේ ද, එවැනි තැන්වලට නොපසුබසිනා සිතින් යුතුව දීම කළ යුතු ය. එයින් ජනිතවන පින් ප්‍රාණීන්ට පර ලොව දී පිහිට වේ.

මෙසේ දන් දුන් තැනැත්තියක් වූ අග්‍ර ප්‍රත්‍ය දායිකා විශාකාව ඇතුන් පස් දෙනෙකුගේ ශරීර බලයෙන් යුතු වූවා ය. දරුවන් විසි දෙනෙක් ලබා හොඳ පෙනුමෙන් යුතු වූවා ය. බොහෝ කල් ජීවත් වූවා ය. නිවැරදි වැටහීමේ නුවණින් යුතු වූවා ය.

## සප්පුරිස දාන සූත්‍රය

(අංගුත්තර නිකාය)

මහණෙනි, සප්පුරිස දීමනා පහකි. එම පහ කවරේ ද? සද්ධාවෙන් දීම ය. සැලකිල්ලෙන්, ගෞරව සහිත දීම ය. සුදුසු කාලයෙහි දීම ය. බලාපොරොත්තු අතහැර දීම ය. තමා උසස්ව කැපී පෙනෙන ලෙස අනුන්ව හෙළා දැක්වීම් වශයෙන් නොකොට ගුණ නොනසා දීම ය.

සද්ධාවෙන් දන් දී, යම් යම් තැනක විපාක උපදී ද, දැකුම්කලු

ප්‍රසාද ජනක විශිෂ්ඨ වූ වර්ණවත් රූප සම්පත් සහිතව සමෘද්ධිමත් වූ බොහෝ ධනය හා භෝග සම්පත් ලබයි.

සැලකිල්ලෙන් යුතුව ලබන කෙනාට ප්‍රයෝජන ගත හැකි පරිදි සුදුස ලෙස සකස්කර, ගරු සරුව දන් දී යම් යම් තැනක දී විපාක දේ ද, එහිදී සමෘද්ධිමත් වූ බොහෝ ධනය සහ භෝග සම්පත් ලැබ, තමාට ගරු කරන, සැලකිල්ලෙන් වැඩ කරන අඹුදරුවන් හා සේවක සේවිකාවන්, කම්කරුවන්, සිසු දරුවන් ලබයි.

සුදුසු කාලයෙහි දන් දී එහි විපාක දේ ද, ඒ ඒ තැනදී සමෘද්ධිමත් වූ ධනය හා භෝග සම්පත් සමඟ සුදුස අවස්ථාවේදීම බොහෝ අභිවෘද්ධිය වේ.

දෙන දෙය සිතින් අතහැර, ලබන්නාගෙන් කිසිවක් බලාපොරොත්තු නැතිව දන් දී යම් යම් තැනක එහි විපාක දෙන කල් හී සමෘද්ධිමත් වූ ධනය හා භෝග සම්පත් ලැබ, පස් වදෑරුම් වූ කැමතිවන සම්පත් පරිභෝග කරන්නෙකු වේ.

තමාගේ ද, අනුන්ගේ ද ගුණ නොනසාගෙන දන් දී යම් යම් තැනෙක විපාක දේ ද, එකල්හී සමෘද්ධිපත් වූ ධනය, භෝග සම්පත් ලැබ, ලැබූ වස්තුව දියෙන්, ගින්නෙන්, රජුන්ගෙන්, සොරුන්ගෙන්, අකමැති අයගෙන් විනාශ වන්නේ නැත.

වැඩෙන ගසක් කැපූ විට එම ගසෙහි ප්‍රධාන කඳ වූ එක් අත්තක් එම ගසට අහිමි වේ. කලක් ගිය පසු අතු රිකිලි කිහිපයක් වැඩේ. ඒවා ද නැවත කප්පාදු කළ විට, බොහෝ අතු රිකිලි වැඩී එම ගස පඳුරක් බවට පත් වේ.

එමෙන් ඔබ සතු දෙයක් වෙනත් අයෙකුට දීමෙන් එම වස්තුව ඔබට අහිමි වේ. එහෙත් කල් යන විට ඔබට බොහෝ වස්තුව ලැබේ. ඔබ දුන් දෙයකින් ලබන්නා සතුටු වේ ද, එම හේතුවෙන් අනාගතයෙහි ඔබට බොහෝ සතුට ලැබේ. ඔබ දුන් දෙයකින් ලබන්නා යම් සැපයක් ලබයි ද එම හේතුවෙන් මතු කල්හි ඔබට බොහෝ සැප ලැබේ. ඔබ දුන් ආහාරයෙන් කුස පුරවාගෙන ලබන්නා ගේ සිරුරෙහි ලේ, මස් වැඩී

සිරුර පැහැය සහ ශක්තිය ලැබෙයි ද, අනාගතයෙහි ඔබට කාය බල, ඥාණ බල සහිත පැහැපත් කයක් ද ලැබේ. මෙය විශ්ව සාධාරණ වූ හේතුඵල දහමයි. මේ පරම සත්‍ය ධර්මතාවය බොරු කිරීමට හෝ නැති කිරීමට කිසිවෙකුට නො හැකි ය.

ඇතුන් දස දෙනෙකුගේ කාය බලය ද, ඥාණ බලය ද ලැබ, දෙතිසක් මහා පුරිෂ ලකුණින් පිරිපුන්, කොතෙක් බැලුවත් සෑහීමකට පත් නොවෙන දේහ සම්පත්තියක් බුදු රජාණන් වහන්සේට ලැබුණේ පුණ්‍ය විපාක වශයෙනි. එබැවින් අපි ද සප්පුරිස ධර්මයෙහි පිහිටා දීම සඳහා සිත් පුරුදු කරමු.

## සප්පුරිස දීමනා අටක්

(අංගුත්තර අට්ඨක නිපාතය)

මහණෙනි, මේ සප්පුරිස දාන අටකි. ඒ කවරේ ද? පිරිසිදු දෙය දෙයි. ප්‍රණීත දෙය දෙයි. සුදුසු කාලයෙහි දෙයි. සුදුසු දෙයක් දෙයි. නුවණින් පරීක්ෂාකර, විමසා බලා දෙයි. නිතර නිතර දෙයි. සිත පහදාගෙන ම දෙයි. දීමෙන් පසු සතුටු වෙයි. මහණෙනි, මේ සප්පුරිස දාන අට ය.

මෙහි සප්පුරිස දාන වශයෙන් පෙන්වා ඇත්තේ බුද්ධාදී සප්පුරිස උතුමෝ දෙන ක්‍රමය යි. එවැනි දීමනා මහත් විපාක ඇති කරන බැවින් අපි ද එසේ දීමට පුරුදු වෙමු.

## මහත් ඵල නොවෙන හා මහත් ඵල වෙන දාන

(අංගුත්තර සත්තක නිපාතයෙනි)

එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ චම්පා නුවර ගග්ගරා පොකුණු තීරයෙහි වැඩ වසන සේක. එකල්හී චම්පා නුවර වැසි, උපාසක පිරිසක් අග්‍ර ශ්‍රාවක සාරිපුත්ත තෙරුන් වහන්සේ වෙත පැමිණ, බුදු රජාණන් වහන්සේගෙන් බොහෝ කලකින් ධර්මයක් අසන්න නොලැබුණ බැවින් ධර්මයක් අසන්න ඕනෑ බව පැවසූහ.

එසේ නම් පොහොය දිනට පැමිණෙන ලෙස උන් වහන්සේ පැවසූ සේක. ඉන් පසු එම පිරිස ගොස් පොහොය දින පැමිණි පසු, බුදු රජාණන් වහ්නසේ ළඟට කැඳවාගෙන යන ලදි. අනතුරුව භාග්‍යවතුන් වහන්සේට වැඳ පසෙකින් වාඩි වූ සාරිපුත්ත මහ රහතන් වහන්සේ මෙසේ ඇසූ සේක.

ස්වාමීනි භාග්‍යවතුන් වහන්ස, ඇතැම් කෙනෙක් දෙන දානයක් මහත්ඵල නොවේ නම්, එබඳු දානයක් තිබේ ද? ඇතැම් කෙනෙක් දෙන දානයක් මහත්ඵල වේ නම්, එබඳු දානයක් වේ ද? සාරිපුත්තයෙනි, එබඳු දාන ඇත. භාග්‍යවතුන් වහන්ස, ඒ කෙබඳු දීමනාවක් ද?

සාරිපුත්තයෙනි, ඇතැම් කෙනෙක් බලාපොරොත්තු තබාගෙන දන්දෙයි. විපාකයට බැඳී, අත නොහැර දෙයි. පින් රැස් කරන අදහසින් දෙයි. මේ දෙන දෙයෙහි විපාක පර ලොවදී පරිභෝග කරන අදහසින් දෙයි. ඔහු එම අදහසින් ශ්‍රමණයෙකුට හෝ බ්‍රාහ්මණයෙකුට ආහාර පාන, වස්ත්‍ර, පාවහන්, මල් සුවඳ විලේපන, ඇඳ, පුටු, වාසස්ථාන, ආලෝක උපකරණ දන් දෙයි.

සාරිපුත්තයෙනි, මෙබඳු දාන දෙනු ලැබේ ද? එහෙමයි භාග්‍යවතුන් වහන්ස, සාරිපුත්තයෙනි, ඇතැම් කෙනෙක් අපේක්ෂා ඇතිව, බැඳීමෙන් යුතුව පරලොවදී පරිභෝග කරන අදහසින් නිදන් කිරීම් වශයෙන් දන් දී මරණින් පසු චාතුම්මහාරාජික දෙව් ලොව උපදී. ඔහු එම කර්මය ගෙවා එම පුණ්‍ය ඉද්ධිය, යසස, අධිපති බව ගෙවී නැවත මේ මිනිස් ලොවට ඉපදීම් වශයෙන් පැමිණේ.

සාරිපුත්තය, ඇතැම් කෙනෙක් තමාගේ මව්පියන් දෙන ලද දාන නවත්වන්න හොඳ නැතැයි සිතා කුල වංශ චාරිත්‍රය රැකීම පිණිස දන් දෙයි....

සාරිපුත්තය, ඇතැමෙක් දන් දීම හොඳ දෙයක් යැයි සිතා දන් දෙයි....

එමෙන් ම ඇතැම් කෙනෙක් මම උයාගෙන, පරිභෝග කරමි. කෑම පිසීම නොකරගන්නා වූ මුන් වහන්සේලාට නොදී සිටීම නොසුදුසු යැයි සිතා දෙයි...

ඇතැමෙක් පෙර මහා දන් දුන් අය ගැන අසා. මමත් එසේ දෙමි යැයි සිතා දන් දෙයි. එහි විපාක වශයෙන් දෙව් ලොව සැප විඳ, එම පුණ්‍ය කර්මය, පුණ්‍ය ඉද්ධිය, යසස, අධිපති බව ගෙවී නැවත මෙහි මිනිස් ලොව උපදී.

ඇතැම් කෙනෙක් දන් දීම නිසා සතුටක්, ප්‍රීතියක් ඇතිවෙන නිසා දන් දෙයි. එහි විපාක දෙව් ලොව දී විඳ, කර්මය ගෙවී එයින් ජනිත පුණ්‍ය ඉද්ධිය, යසස, අධිපති බව ද අවසන් වී නැවත මෙහි උපදී.

ඇතැම් කෙනෙක් සමථ, විදර්ශනා සිතට අනුබල දීම පිණිස භාවනා සිතට අලංකාරයක්, උපකාර දෙයක් යැයි සිතා දන් දෙයි. සාරිපුත්තයෙනි මෙවැනි දීම සිදු කෙරේ ද? එහෙමයි භාග්‍යවතුන් වහන්ස,

සාරිපුත්තයෙනි, ඔහු එසේ දන් දී භාවනාවෙන් සිත වඩා, ධ්‍යාන උපදවා, මරණින් පසු බ්‍රහ්ම ලෝකයේ උපදී. ඔහු එහිදී එම කුසල කර්මය ගෙවා එම පුණ්‍ය විපාක, පුණ්‍ය ඉද්ධිය, යසස, අධිපති බව අවසන්ව ආපසු ඉපදීමට මෙහි නොපැමිණේ. එහිදීම පිරිනිවන් පාන්නේ ය.

සාරිපුත්තයෙනි, ඇතැමෙක් දෙන දන මහත්ඵල නොවීමටත්, ඇතැමෙක් දෙන දන මහත් ඵල වීමට නම් මේ හේතුව වේ.

මෙම සූත්‍ර දේශනාවට අනුව මුලින් කියන ලද කරුණු අනුව දුන් දනයක විපාක විඳ, නැවත පහළට පැමිණ නැවත පඤ්චස්කන්ධ ලබන බැවින් මහත්ඵල නොවෙන දනයි. මේ අතීතයෙහි බොහෝ දෙන දන් දුන් ආකාරය යි. වර්තමානයෙහි බොහෝ දෙනා දන් දෙන්නේ මිය ගිය අයට පින් දීමට යි. එහි පිනක් සිදු වුණත් මහත්ඵල නොවේම ය.

අවසානයට පෙන්වා ඇති පරිදි භාවනාවට උපකාර පිණිස දීම නිවන් පතා දන් දීම යි. මෙසේ පාරමී ශීර්ෂයෙන් නිවන් පතා දෙන ලද දනම මහත් ඵල මහානිසංස වේ. භාවනාවට උපකාර පිණිස නිවන් පතා දන් දුන්නැයි කියා දෙව් මිනිස් සැප නොලැබී යන්නේ නැත. හේතු

ඵල දහමට අනුව දෙව් මිනිස්මය වූ ලෞකික සැප ලැබේම ය. එබැවින් නිවන් පතා දන් දෙමින් නිවනම මුල් තැනට තබාගෙන දන් දීමට සැම දෙනාම පුරුදු කර ගැනීම සුදුසු ය.

## අංග සයෙන් යුතු දීමනාව

(අංගුත්තර ඡක්ක නිපාතයෙනි)

එක් කලෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ සිටි සේක. එකල්හි වේළුකණ්ඨකී නුවරෙහි අනාගාමී ආර්ය ශ්‍රාවිකාවක් වූ නන්ද මාතාව සාරිපුත්ත මොග්ගල්ලාන ප්‍රමුඛ මහා සඟ රුවනට දනයක් පිරිනැමුවා ය. මෙය දිවැසින් දුටු භාග්‍යවතුන් වහන්සේ.

මහණෙනි, වේළුකණ්ඨකී නුවර නන්ද මාතාවගේ නිවසෙහි ඇය විසින් සැරියුත් මුගලන් දෙනම ඇතුළු භික්ෂු සංඝයා වහන්සේට අංග සයකින් යුතු දනයක් දෙනවා. මහා සාගරයෙහි ජලය මෙන් එහි ආනිසංස ප්‍රමාණ කළ නොහැක යැයි වදාළ සේක.

ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස අංග සයකින් යුතු දනය දෙන්නේ කෙසේ දැයි එක් ස්වාමීන් වහන්සේ නමක් විමසුවේ ය.

දීමට පෙර සිත පසු නොබසින ලෙස අකුසල් ඇති වෙන්න නොදී හොඳින් පවත්වා ගැනීම ය. ප්‍රසාද ජනක සිතින් දීමය. දීමෙන් පසු එම දීම ගැන නැවත නැවත සතුටු වීම යන අංග තුන දයක හෙවත් දෙන්නා තුළ පැවතීම ය.

රාගය දුරු කර සිටීම හෝ රාගය දුරු කිරීමට පිළිවෙත් පිරීමය. තරහා දුරු කළ කෙනෙක් වීම හෝ තරහා දුරු කිරීමට පිළිවෙත් පුරන්නෙකු වීම, මුලාව දුරු කළ කෙනෙකු වීම හෝ මුලාව දුරු කිරීමට පිළිවෙත් පුරන්නෙකු වීම යන කරුණු තුන් ලබන්නාගේ අංග තුන යැයි අංග සයක් වේ.

මේ අනුව බොහෝ අනුසස් ලැබීමට කැමති වෙන නුවණැත්තන් විසින් මෙම අංග සය යෙදෙන පරිදි දන් දීමට පුරුදු විය යුතු ය.

## සප්පුරිස හා අසප්පුරිස දීමනා පහක්
(අංගුත්තර පඤ්චක නිපාතයෙනි)

මහණෙනි, සප්පුරිස දීමනා පහක් ඇත. එය කවරේ ද? ලබන්නාට ප්‍රයෝජන ගැනීමට පහසුවන අයුරින් සකස්කර දීම, සැලකිල්ලෙන්, ගෞරවයෙන් දීම, තමන් සතු දෙය තමා විසින් ම දීම, ප්‍රයෝජනවත් වූ දෙයක් ම දෙයි, කර්මඵල විශ්වාසයෙන් දෙයි. මහණෙනි, මේ සප්පුරිස දාන පහයි.

මහණෙනි, අසප්පුරිස දීමනා පහකි. ඒවා කවරේ ද? සකස් නොකර දෙයි. නොසැලකිල්ලෙන් දෙයි. අගෞරවයෙන් දෙයි. තමන් සතු දෙය තමා නොදී සේවකාදී අනුන් ලවා දෙයි. ප්‍රයෝජනයක් නැති ඉවත ලද දෙයක් මෙන් දෙයි. කර්ම ඵල විශ්වාසයක් නැතිව දෙයි. මහණෙනි, මේ අසප්පුරිස දීමනා පහයි.

## සීහ සේනාපති සූත්‍රය
(අංගුත්තර පඤ්චක නිපාතයෙනි)

එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ විශාලා මහ නුවර කූඨාගාර ශාලාවෙහි වැඩ හිඳිනා අවස්ථාවක සීහ සේනාපතිතුමා භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ, වැඳ, පසෙකින් හිඳ මෙසේ ඇසී ය.

ස්වාමීනී, තමා විසින් ම දැකගත හැකි දානානිසංස පැනවිය හැකි ද? සීහය හැකි ය. සීහය දන් දෙන දානපති කෙනා බොහෝ දෙනාට ප්‍රිය වේ. දානපතිකෙනාගේ ගුණ ඝෝෂාව පැතිරේ. බොහෝ සප්පුරිසයෝ දානපති කෙනා ඇසුරු කරති. දායක වූ දානපති කෙනා රජ, බමුණු, ගෘහපති, පැවිදි කුමන පිරිසක් වෙත ගියත් භය නැතිව විශාරදව යයි. දායක වූ දානපති කෙනා මරණින් පසු සුගතියෙහි උපදී.

මෙසේ වදාළ පසු සීහ සේනාපතිතුමා භාග්‍යවතුන් වහන්සේට මෙසේ පැවසිය. ස්වාමීනී භාග්‍යවතුන් වහන්ස, තමා විසින් දැකිය යුතු දානානිසංස සතරක් වදාළේ ද, ඒවා භාග්‍යවතුන් වහන්සේගේ කියාදීම අනුව සද්ධාවෙන් පිළි නොගනිමි. එම කරුණු මම ද දනිමි. ස්වාමීනී

බොහෝ දෙනා මාව ප්‍රිය කරති. සන්සිඳුන සිත් ඇති සත් පුරුෂ වූ බොහෝ දෙනා මාව ඇසුරු කරති. සීහ සෙන්පතිතුමා දන් දෙන කෙනෙකි. සංඝයාගේ කැපකරු දායකයෙකි. (සුදුසු දේ දෙන්නෙකි) සංඝ උපස්ථායකයෙක් කියා මගේ ගුණ ඝෝෂාව පැතිරී ඇත. රජ, බමුණු, ගෘහපති, පැවිදි ඕනෑම පිරිසක් වෙතට මම නොහියව, විශාරදව යමි.

දන් දෙන දායක කෙනා මරණින් පසු සුගතියෙහි උපදී යැයි භාග්‍යවතුන් වහන්සේ වදාළේ ද ඒ බව මම නොදනිමි. එහෙත් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් එය පිළිගනිමි.

එවිට සීහය එය එසේම යි. එය එසේම යි. දානපති වූ දායක තෙමේ මරණින් පසු සුගතියෙහි උපදී යැයි බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## තෙවැදෑරුම් දායකයෝ

දාන දෙන අය අතුරෙන් තමන් කන බොන, අඳින පළඳින, පරිභෝග කරන අයුරින් නොදී, ඉතාම සුළු දෙයක්, නොදී බැරි කමට නොසැලකිල්ලෙන් දෙන කෙනා දාන සංඛ්‍යාත දිය යුතු දෙයට දාසයෙකු මෙන් දෙන පුද්ගලයා දාන දාස ය.

යමෙක් තමන් කන බොන, අඳින පළඳින, පරිභෝග කරන අයුරින්ම දෙන කෙනා දාන සංඛ්‍යාත දිය යුතු දෙයට සමානත්වයෙන් යහලුවකු මෙන් දෙන බැවින් ඔහු දාන සහාය නම් වේ.

යමෙක් තමන් කන බොන, අඳින පළඳින, පරිභෝග කරන ආකාරයට වඩා උසස් ලෙස දෙන පුද්ගලයා දාන සංඛ්‍යාත දිය යුතු දෙයට ස්වාමීත්වයෙහි පිහිටා දෙන බැවින් ඔහු දානපති නම් වේ.

දානපති හෙවත් පරිත්‍යාගය ලෝකයෙහි සප්පුරුෂයෝ, පණ්ඩිතයෝම පනවා ගත් දෙයක් බව භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇති බැවින් ශ්‍රද්ධාවන්තයෝ නොමසුරුව දානපතිව දන් දී ලෞකික, ලෝකෝත්තර සුව ලබති.

## දක්ඛිණා විභංග සූත්‍රයෙන් පුද්ගලික දන 14
(මජ්ඣිම නිකාය)

01. තිරිසන් සත්වයන්ට දෙන දනය
02. දුස්ශීලයෙකුට දෙන දනය
03. පෘතග්ජන සිල්වතාට දෙන දනය
04. බුදු සසුනෙන් පිට ධ්‍යාන ලාභියෙකුට දෙන දනය
05. සෝවාන් වීමට පිළිවෙත් පුරන්නාට දෙන දනය
06. සෝවාන් ඵලය ලැබූ කෙනාට දෙන දනය
07. සකදගාමී වීමට පිළිවෙත් පුරන්නාට දෙන දනය
08. සකදගාමී ඵලය ලැබූ කෙනාට දෙන දනය
09. අනාගාමී වීමට පිළිවෙත් පුරන්නාට දෙන දනය
10. අනාගාමී ඵලය ලැබූ කෙනාට දෙන දනය
11. රහත් වීමට පිළිවෙත් පුරන්නාට දෙන දනය
12. රහත් ඵලය ලැබූ කෙනාට දෙන දනය
13. පසේ බුදු රජාණන් වහන්සේට දෙන දනය
14. සම්බුදු රජාණන් වහන්සේට දෙන දනය

තිරිසන් සත්වයෙකුට කුස පුරා දෙන දනයට ආයු, වර්ණ, සැප, බල සියක් ගුණයෙන් ලැබේ. දුස්ශීල කෙනෙකුට කර්මඵල අදහා අනුකම්පාවෙන් දෙන දනයට දහස් ගුණයෙන් විපාක ලැබේ. පෘතග්ජන සිල්වතාට දෙන දනයෙහි විපාක ලක්‍ෂ ගුණයෙන් ලැබේ. බුදු සසුනෙන් පිට ධ්‍යානලාභී කෙනෙකුට දෙන දනයෙහි විපාක කෝටි ලක්‍ෂ ගුණයෙන් ලැබේ. සෝවාන් වීමට පිළිවෙත් පුරන්නාගේ පටන් සම්බුදු රජාණන් වහන්සේ දක්වා දෙන දනයෙහි විපාක අසංඛ්‍යය, අප්‍රමාණව ලැබේ.

## සඞ සතු දන සතකි

01. බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ භික්‍ෂු භික්‍ෂුණී දෙපිරිසට දෙන දනය.
02. තථාගතයන් වහන්සේ පිරිනිවී පසු, භික්‍ෂු භික්‍ෂුණී සඞ දෙපිරිසට දෙන දනය.
03. භික්‍ෂු සංඝයාට දෙන දනය.

04. භික්ෂුණී සංඝයාට දෙන දානය.
05. සඝ දෙපිරිසෙන්ම සංඝයා උදෙසා දහ නමක්, විසි නමක් ආදී වශයෙන් ප්‍රමාණයක් නියමකොට ආරාධනා කර දෙන දානය.
06. භික්ෂු සංඝයා උදෙසා දස නමක් ආදී වශයෙන් ප්‍රමාණයක් නියම කර, ආරාධනා කර දෙන දානය.
07. භික්ෂුණී සංඝයාගෙන් දස නමක් ආදී වශයෙන් ආරාධනා කර දෙන දානය.

මෙම සඝ සතු දාන හතෙන් ප්‍රමාණ වශයෙන් නියම නොකර භික්ෂු සංඝයා උදෙසා දෙන දානය සහ සංඝයාගෙන් සඟ සතු දානයක් සඳහා මෙපමණ ස්වාමීන් වහන්සේලා ලබා දෙන්නැයි ආරාධනා කර, දෙන දානය යන දාන දෙක පමණක් වර්තමානයේ දී දිය හැක. සෙසු සාංඝීක දාන දිය නො හැක.

## විශේෂ කරුණක්

මෙම සාංඝීක දාන සතෙන් මුල් දාන සතර ප්‍රමාණයක් නොකළ බැවින් තුන් කල් සංඝයා උදෙසා සඟ සතු කළ හැකි වුවත්, ඉතිරි දාන තුන ප්‍රමාණයක් නියම කරන බැවින් තුන් කල්හි සංඝයා උදෙසා පූජා කිරීමට නො හැකි ය. එපමණක් නොව එම දාන සඟ සතු වීමට නම් අපට සාංඝීක දානයක් සඳහා භික්ෂු සංඝයාගෙන් මෙපමණක් ස්වාමීන් වහන්සේලා ලබා දෙන්න යැයි ''සංඝ'' යන වචනය යොදා ආරාධනා කළ යුතු ය. එසේ නැතිව සියක් නමක් වඩමවා දුන්නත් එය පුද්ගලික දාන සීයක් මිස සඟ සතු දානයක් නොවේ. පුද්ගලිකව ආරාධනා කළත්, තේරීමක් නැතිව සමාන සිතින් සියලු දෙනා වහන්සේලාට දානය දෙනවිට සංඝ සඤ්ඤාවෙන් ම දිය හැකි නම් එය සඟ සතු දානයක් වේ.

## දානය මහත්ඵල නොවන කරුනු

යම් දුස්ශීලයෙක් අධාර්මිකව ලැබූ වස්තුවෙන් සිතේ පැහැදීමක් නැතිව, කර්මඵල විශ්වාසයක් නැතිව දුස්ශීල කෙනෙකුට දානයක් දුන්නත් පිනක් සිදුවේ. එහෙත් මහත් ඵල නොවේ. විපාක ඉතා ස්වල්පයක් ලැබේ.

යම් දුස්සීලයෙක් අධර්ම වස්තුවෙන්, අප්‍රසන්න සිතින්, කර්මඵල විශ්වාස නොකර සිල්වතෙකුට දනයක් දේ නම් එම දනය පිළිගන්නා වූ සිල්වත් නිසා පිරිසිදු වේ.

යම් සිල්වතෙක් දැහැමිව ලබා ගත් වස්තුවෙන්, ප්‍රසන්න සිතැතිව, කර්මඵල විශ්වාසයෙන් දුස්සීලයෙකුට දනයක් දේ නම් එම දනය දෙන්නා වූ කෙනාගේ පැත්තෙන් පිරිසිදු වේ.

යම් සිල්වතෙක්, දැහැමි වස්තුවෙන්, ප්‍රසන්න සිතින් කර්මඵල විශ්වාස කර සිල්වතෙකුට දනයක් දේ නම්, එම දනය අතිශයින් ම මහත්ඵල වේ.

මෙසේ මහත්ඵල වුණත්, මුලින් ප්‍රසන්න සිතින් දී පසුව පසුතැවිලි වුනොත් අනේ අපරාදේ දුන්නේ. දුන්නට වඩා නොදුන්නනම් හොඳ යැයි සිතුවේ නම් එම දූෂිත සිතෙහි අකුසල චේතනාවේ විපාක වශයෙන් කොතෙක් වස්තුව ඇතත්, හොඳ දේ ඇතත්, උසස් දේ ඇතත්, අග්‍ර දේ ලැබුණත් ඒවා පරිභෝජනය කරන්න සිත නොනැමේ. දුක සේ ජීවත්වීමට සිදු වේ.

## පුණ්‍ය ගංගා පහක්

(අංගුත්තර - අට්ඨක නිපාතය)

මහණෙනි, දීර්ඝ කාලයක පටන් සත්පුරුෂයන්ගේ වංශයට අයත් ඉතා පැරණි දෙයක් කියා ඉවත් නොකළ, දැනුත් ඉවත නොදන, අනාගතයටත් ඉවත් නොකරන්නා වූ නුවණැති ශ්‍රමණ බ්‍රාහ්මණයන් විසින් පිළිකුල් නොකරන්නා වූ, අග්‍ර වූ මහා දන පහක් ඇත. එම දන පහ කවරේ ද?

මහණෙනි, ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ සතුන් මැරීම අතහැර, සතුන් මැරීමෙන් වැළකී, අප්‍රමාණ සත්වයන්ට නිර්භය භාවයත්, අවෛරයත්, නිදුක් බවත් දී අප්‍රමාණ අභයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වේ. මේ එම අග්‍ර වූ මහා දනයක් වූ පළවෙනි දනය යි.

මහණෙනි, නැවත ආර්‍ය්‍ය ශ්‍රාවක තෙමේ සොරකම අතහැර,

සොරකමෙන් වැළකී...., වැරදි කාම සේවනය අතහැර, වැරදි කාම සේවනයෙන් වැළකී..., බොරු කීම අතහැර, බොරු කීමෙන් වැළකී..., මත්වතුර බීම, අතහැර, මද්‍ය පානයෙන් වැළකී, අප්‍රමාණ සත්වයන්ට නිර්භය භාවය, අවෛරය (මෛත්‍රිය), නිදුක් බවත් දී අප්‍රමාණ වූ නිර්භය භාවයට, අවෛරයට, නිදුක් බවට හිමිකරුවෙක් වේ.

මහණෙනි, සැප ඇති කරන, සැපයෙන් අග්‍ර වූ සැප විපාක ගෙන දෙන, ඉෂ්ඨ කාන්ත කැමති වූ, හිත සුව පිණිස ස්වර්ගය පිණිස පවතින පුණ්‍ය ගංගාවෝ කුසල ගංගාවෝ ය.

මෙම දේශනාවට අනුව තිසරණ සමාදානය සමඟ පඤ්ච ශීලය රැකීම පින් ගලන කුසල් උපදින්නා වූ මහා උල්පත් අටක් වන අතර, පඤ්ච ශීලය රකිමින්, පස් පවින් වළකින කෙනාගෙන් කිසිවෙකුට මාව හෝ මගේ ඥාතීන් මරාවී, මගේ හෝ අපේ වස්තුව පැහැර ගනීවි, මගේ හෝ අපගේ බිරියන් හා දරුවන් සමඟ අනාචාරයේ යෙදේවී, බොරු කියා අපව රවටාවි, මත් වතුර, මත් ගුලි, මත් කුඩු භාවිතය කිරීම නිසා අපට, මට කරදර විපත් පමුණුවාවී කියා කිසි බයක් ඇති නොවන බැවින් ඔහු සියල්ලන්ටම අභය දෙන්නේ ය.

එම වැරදි නොකිරීමෙන් ම බොහෝ දෙනාට ඔහු මෛත්‍රී කරන්නෙකි. සතුරු නොවන්නෙකි. අවෛරය දෙන්නෙකි. ඒ හේතුවෙන් කිසිවෙකුට ඔහුගෙන් කරදර පීඩා නොවන බැවින් නිදුක් බව දෙන්නෙකි. එබැවින් ධනය වියදම් නොකර, වෙහෙස නොවී, දිය හැකි අග්‍ර වූ මහා දන පහ මේ පස් පවින් වැළකීම බව සියල්ල දැනගත්තා වූ භාග්‍යවතුන් වහන්සේ වදාළ සේක.

එමෙන් අන්‍යයන් පස් පවින් වළකන්නේ නම් එහි ගුණ කියන්නේ නම් එයින් ද ඔහු මහා දනපතියෙක් වන්නේ ය.

මෙබඳු දනයන්ගේ වටිනාකම නොදැන, මුලාවෙන් යමෙක් අනුන්ගේ දීමනා වළක්වන්නේ නම්, දෙන්නාගේ පිනට ද, ලබන්නාගේ ලාභයට ද, අනතුරු කරමින් තමාගේ ගුණය නසා ගන්නා බැවින් ඔහු තුන් දෙනෙකුට අනතුරු කරන්නෙකු බව බුදු රජාණන් වහන්සේ වදාළ සේක.

## මච්ඡරී සූත්‍රය - (සංයුක්ත නිකාය)

බුදු රජාණන් වහන්සේ වෙත පැමිණි දේවතාවෙක් මෙසේ ඇසී ය.

මේ ලෝකයෙහි තමන් සතු දේ අනුන්ට දීමට අකැමති, තද මසුරු වූ පැවිද්දන්ට හා තමාගෙන් යමක් ඉල්ලා එන දුගී, මගී, යාචකාදීන්ට බනින, අනුන් දන් දෙන කල් හී ඒවාට අනතුරු කරමින්, වළක්වන මනුෂ්‍යයින්ට එයින් ලැබෙන විපාක මොනවාද? ඒ අයගේ පරලොව යාම කෙසේ වේ ද? කියා අපි කෙසේ දැන ගනිමුද? එය භාග්‍යවතුන් වහන්සේගෙන් අසා දැන ගැනීමට ආවෙමු.

එවිට භාග්‍යවතුන් වහන්සේ තමා සතු දේ අනුනට දීමට අකමැති, තද මසුරු වූ ද, තමාගෙන් යමක් ඉල්ලා ගැනීමට පැමිණෙන අයට පරිභව කරන, අනුන් දෙන දන වළක්වමින් ඒවාට අනතුරු කරන මනුෂ්‍යයෝ මරණින් පසු නිරයට, තිරිසන් අපායට, ප්‍රේත භවට පත් වේ.

යම් හෙයකින් එයින් මිදී, මිනිස් ලොව උපදින කල්හි දිළිඳු තැන්වල උපදී, ඇඳුම් පැළඳුම්, ආහාර පානාදිය ද, පඤ්ච කාම සැප ද, දුකසේ ලබයි. අනුන්ගේ යමක් බලාපොරොත්තුවේ ද ඒවා ද නොලබයි. ඔවුන්ට මෙලොවදී අභාග්‍යය ද, පරලොවදී දුගතිය ද හිමි වේ.

## තමොතම සූත්‍රය - (සංයුක්ත නිකාය)

පසේනදී කොසොල් රජුට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක.

මහරජ, යමෙක් දිළිඳු වූයේ ද, මසුරු වූයේ ද, දැඩි ලෝභයෙන් යුක්ත ද, සද්ධාව නැත්තේ ද, පහත් අදහස් ඇත්තේ ද, මිත්‍යා අදහස් ඇත්තේ ද, ගරු කළ අයට ගරු නොකෙරේ ද, ශ්‍රමණ බ්‍රාහ්මණ වූ පූජ්‍ය පක්ෂයට ද, දුගී, මගී, යාචක අයට දෙස් කියා ද, කර්ම විපාක පිළිනොගන්නේ වේ ද, ඒවා වළක්වන්නේ වේ ද, රජතුමනි, එබඳු කෙනා මරණින් පසු දරුණු දුක් ඇති නිරයෙහි උපදී. මෙසේ ඔහු අඳුරෙන් අඳුරට යයි.

මහ රජ, යමෙක් දිළිඳු වූයේ ද, එහෙත් සද්ධාව ඇත්තේ ද, මසුරුකම් නැත්තේ ද, උතුම් අදහස් ඇත්තේ ද, පසු නොබසින සිතින් දන් දේ ද, ශ්‍රමණ බ්‍රාහ්මණ, දුගී, මගී, යාචකයන්ට, තමා වෙත එන පූජ්‍ය පක්ෂයට වහාම අසුනින් නැඟිට වඳින්නේ ද, සෙසු අයට සමානව සලකන්නේ ද, අනුන්ගේ දීමනාවලට බාධා නොකරන්නේ ද, ජනාධිපති රජතුමනි, එවැනි කෙනා මරණින් පසු දේවත්වයට පැමිණෙයි. ඔහු අඳුරෙන් ආලෝකයට යයි.

මහ රජ, යමෙක් පොහොසත් වූයේ ද, එහෙත් සද්ධාව නැති ද, මසුරුගති ඇත්තේ ද, පාපී අදහස් ඇත්තේ ද, මිත්‍යා දෘෂ්ඨික වේ ද, ගරු කළ යුත්තන්ට ගරු නොකෙළේ ද, පැවිදි අයට හා දුගී, මගී හා යාචකයන්ට නින්දා පරිභව කොරේ ද? අනුන්ගේ දීමනා (දාන) වළක්වයි ද, ඒවාට අනතුරු කෙරේ ද, ඔහු මරණින් පසු ඝොර වූ නිරයේ උපදී. හෙතෙම එළියෙන් අඳුරට යයි.

මහ රජ, යමෙක් පොහොසත් වේ ද, සද්ධා අත්තෙක් ද, මසුරු ගති නැත්තේ ද, උතුම් අදහස් ඇත්තේ ද, පසු නොබසින සිතින් දන් දේද, පැවිදි උතුමන් තමා වෙත එන විට අසුනෙන් නැගිට වඳින්නේ ද, සෙසු අයට සම ලෙසින් සලකන්නේ ද. අනුන්ගේ දීමනාවලට බාධා නොකෙරේ ද, නොවළක්වයි ද, ජනාධිපති රජතුමනි, එබඳු කෙනා මරණින් පසු දේවත්වයට පත් වේ. ඔහු ආලෝකයෙන් ආලෝකය කරා යයි.

## **ආදිත්ත සූත්‍රය -** (සංයුක්ත නිකාය)

ගෙයක් ගිනි ගෙන දැවෙන කල් හී, එම ගෙයින් යමක් බැහැර කළොත් එය මතුවට ප්‍රයෝජන වේ. නොහැකි වූ සියල්ල අහිමි වේ. ගෙය සමඟ දැවේ.

එපරිද්දෙන් ලෝක සත්වයාද ජරා, මරණ සංසාර දුක් ගින්නෙන් නිරතුරු දැවේ. එබඳු ජීවිතවලින් දානමය වශයෙන් තම වස්තුව බැහැර කළ යුතු ය. එසේ දෙන ලද දෙය මැනවින් බැහැර කරන ලද්දේ මතු සැප ගෙන දේ. නොදුන් දෙය එසේ නොවේ.

ඉඩ ලැබුණොත් ඒවා සොරු ගනී. රාජ සන්තක වේ. දියෙන්,

ගින්නෙන් හෝ දිරාපත් වී හෝ විනාශ වේ. එසේ නොවුනොත් ශරීරය සමඟ අයිති කරගෙන සිටි සියල්ල අහිමි වේ. මේ කරුණු දැන නුවණැත්තා දීම ද කළ යුතු ය. පරිභෝග කරමින් ප්‍රයෝජන ගත යුතු ය. දීම ද කර, පරිභෝග ද කර, අන්‍යයාගේ නින්දාවට ලක් නොවී සුගතියට ද පැමිණෙයි.

**මච්ඡරි සූත්‍රය -** (සංයුක්ත නිකාය)

බුදු රජාණන් වහන්සේ වෙත පැමිණි දෙව් පිරිස අතරින් එක් දේවතාවෙක් මෙසේ පැවසීය.

මසුරුකම් ඇත්තෝ ද, පිනට ප්‍රමාද වූවෝ ද දීම නොකරති. දීමෙහි විපාක දැනගෙන දීම කළ යුතු ය.

වෙනත් දේවතාවක් මෙසේ පැවසී ය. දීම නිසා තමන් සතු දේ නැතිවීමෙන්, සා පිපාසෙන් දුක් විඳින්න වේ යන බියෙන් මසුරු අය නොදෙති. එහෙත් නොදෙන කෙනාට නොදීම නිසා ම මතුවට නොලැබී, සා පිපාසාදී දුකින් පීඩා විඳීමේ බිය ම ලැබේ. ඔහුට එම බිය මෙලොව, පරලොව දෙකෙදීම ලැබේ.

එබැවින් මසුරුකම දුරු කළ යුතු ය. මසුරු මලය ද දුරු කර, දීම කළ යුතු ය. ප්‍රාණීන්ට පරලොවේදී පින පිහිට වේ.

වෙනත් දේවතාවෙක් මෙසේ පැවසී ය.

ගමනක් යන කල්හී කාන්තාරයකදී තමන් සතු සුළු දෙයින් කොටසක් හෝ තමා සමඟ යන අයට දේ නම්, ඔහු මැරුණත් නොමැරුණා හා සමාන ය. මේ පැරණි දහමෙකි. ඇතැම් අය ස්වල්ප දෙයක් ඇති කල්හි ද දෙන්නේ ය, බොහෝ ඇති කල්හි ඇතැම් අය නොදේ. ස්වල්ප දෙයක් ඇතිව ස්වල්ප දෙයක් හෝ දුන්නේ නම් එය දහසක් වියදම් කර දුන් දානයක් හා සම වේ.

වෙනත් දේවතාවෙක් මෙසේ පැවසී ය. දීමට අමාරු දෙය දෙන, කිරීමට අමාරු දෙය කරන සත් පුරුෂයන්ගේ මේ ධර්මයට අසත්

පුරුෂයන්ට ලන්වීමටත් බැරි ය. අසත් පුරුෂයෝ නිරයට යති. සත් පුරුෂයෝ සුගතියට යති.

භාග්‍යවතුන් වහන්සේට වෙනත් දේවතාවෙක් මෙසේ පැවසී ය. භාග්‍යවතුන් වහන්සේ මේ ප්‍රකාශවලින් කාගේ ප්‍රකාශය යහපත් වේ ද?

එවිට භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළ සේක. ඔබ සැමදෙනාගේ ප්‍රකාශ යහපත් ය. එසේ වුවත් මාගේ ප්‍රකාශයත් අසන්න.

යම් කෙනෙක් ධාර්මිකව ජීවත්වෙමින් දැහැමින් අඹුදරුවන් පෝෂණය කරමින්, තමාට තිබෙන ස්වල්ප දෙයකින් දන් දේ නම් බොහෝ ධනය ඇත්තාගේ ලක්ෂ ගණන් වියදම් කර දෙන දහස් ගණන් පූජාව දැහැමියාගේ දහසයෙන් කොටසක්වත් නොවටී.

මෙයින් කියැවෙන්නේ අධර්මයෙන් ධනය උපයා බොහෝ දෙන දානයට වඩා, දැහැමිව ධනය උපයා ස්වල්ප දෙයක් ඇතිව සිට දෙන ස්වල්ප දෙයට උසස් විපාක ඇති බවයි.

දාන පාරමිතාව මුල් කරගෙන, දස පාරමී සපුරා, අපමණ දෙව් මිනිස් සැප ලබා, බුදු බවට පත් ව, දානය හෙවත් දීම සම්බන්ධ කර දේශනා ත්‍රිපිටකය තුළ තව බොහෝ ඇත. දෙවියන්ගේ ප්‍රකාශ, ඔවුනගේ අත්දැකීම් ය. එය තමා තුළින් තමාම අත් විඳි දේ ය. තථාගතයන් වහන්සේ ද තමා විසින් ප්‍රත්‍යක්ෂව දැනගෙන අත්විඳි දේ ම දේශනා කළ සේක. දානය හෙවත් දීම නම් තණ්හාව පරදවා ජය ගැනීම ය. තණ්හාව ජය ගැනීම නම් දුක නැති කරගැනීම යි. දානය පුරුදු කර තණ්හාව ජය ගෙන දුකෙන් මිදී, සැප ලැබීමට මෙතෙක් කරුණු සෑහේ යැයි සිතමි.

## සංගික දානය

සංඝික දානය යනු බුද්ධ ශ්‍රාවක භික්ෂු සංඝයා උදෙසා යම් දෙයක් දීම යි. ඉහතින් දක්වන ලද සංඝික දාන හතෙහි පළමු දාන තුනට භික්ෂූන් වහන්සේලා හෝ භික්ෂුණීන් වහන්සේලා ගණනින් ප්‍රමාණයක්

නැත. වැඩම කළේ යම් පමණද එපමණ පිරිසට සිතේ වෙනසක් නැතිව සංඝ ගෞරවයෙන් දිය යුතු ය.

ඉතිරි සංඝික දන හත සඳහා සංඝයාගෙන් එක නමක් පටන් තමාට හැකියාව ඇති ප්‍රමාණයකට දීම කළ හැකි ය. සංඝික දනයක් සඳහා සතර නමක් හෝ ඊට වඩා වැඩි පිරිසක් වුවමනා බව බොහෝ දෙනෙක් තුළ ඇති වැරදි මතයකි.

යම් කෙනෙකුට මහත්ඵල ලැබෙන පරිදි සංඝික දනයක් දීමට වුවමනා නම් ඒ සඳහා සිල්වත් ගුණවත් බවක් සෙවීමට අවශ්‍ය නොවේ. සිල්වත් ගුණවත් බව සෙවිය යුත්තේ පුද්ගලික දන සඳහා ය. පුද්ගලික දනයක් ලෙස රහතන් වහන්සේ නමකට දෙන දනයට වඩා සංඝයාගෙන් ලබා ගත් කෙළෙස් සහිත භික්ෂුවකට දෙන දනය මහත්ඵල බල දක්ෂිණ විභංග සූත්‍ර අට්ඨ කථාවෙහි පෙන්වා ඇත.

එක නමටත් දෙනමකටත් තුන් නමකටත් එයිට වැඩි පිරිසකටත් සංඝික දනයකදී ඥාතිකම හෝ හිතවත්කම හෝ උගත් නූගත්කම හෝ ලොකු කුඩා බව හෝ සැලකුවොත් තමා සිටින ගමේ නගරයේ විහාරස්ථානයෙහි ස්වාමීන් වහන්සේලාට එක් ලෙසකටත්, පිටතින් වඩින ස්වාමින් වහන්සේලාට වෙනත් ලෙසකට සැලකුවොත් එය සංඝික දනයක් නොවේ. නමට පමණක් සංඝික වේ.

වැඩි භික්ෂු පිරිසකට බොහෝ ප්‍රමාණයක් දුන්නොත් බොහෝ කුසල් සිදු වෙන බව වැඩි දෙනෙකුගේ මතය යි. එසේ වන්නේ පුද්ගලික දනවලදී ය. මේ වැරදි කල්පනාව නිසා අද කාලේ ඇතැම් අය ස්වාමීන් වහන්සේලාට බොහෝ කරදර කරති. විවේකව මහණ දම් පුරණ ස්වාමීන් වහන්සේලාට ප්‍රයෝජන නැති දේවල් හෝ ඕනෑ තරම් තිබෙන දෙයක් හෝ පූජා කරති.

මෙසේ කිරීමේ දී වාහන සඳහා බොහෝ මුදල් වැය වේ. මේ මුදල් යන්නේ කාටද? එයින් කොටසක් වාහන හිමියන්ට යන අතර, වැඩි මුදලක් ඉන්ධන සඳහා පිටරටට ගෙවනු ලැබේ. දනයට වැඩම වූ ස්වාමීන් වහන්සේලා මොන තරම් වැඩ කටයුතු පාඩු වේ දැයි කිසිවෙක් නොසිතයි. කොතරම් පීඩා විඳී දැයි නොසිතයි.

ආහාර පාන චීවරාදී පිරිකර සඟ සතු භාවය අවලංගු කර

බෙදාගත් පසු ඒවා පුද්ගලික වස්තු බවට පත්වේ. එහෙත් දැව භාණ්ඩ ලෝහ භාණ්ඩ, මැටි භාණ්ඩ, කුටි සේනාසන ආදී විහාරස්ථානයක ස්ථාවර දේ කැඩී බිඳී විනාශ වන තුරු සාංඝික බව අවලංගු නොවේ. එබැවින් එවැනි දේ පූජා කිරීම මහත් ඵල වේ.

එබැවින් තම ගමේ ඇති, නගරයේ ඇති, විහාරස්ථානයේ හෝ ආරණ්‍ය සේනාසනයෙහි ඉන්නේ යම් පමණ ද එක නම, දෙනමට හෝ සංඝ රත්නය වෙනුවෙන් ගෞරව කරමින් දානයක දී පිට රටට යැවීමට වාහනවලට ගෙවන මුදලින් විහාරස්ථානයෙහි අවශ්‍ය ස්ථාවර දෙයක් කළොත් පරම්පරා ගාණක් පොදුවේ සංඝයාට ප්‍රයෝජන වේ. ඒවා තිබෙන තුරු ස්වාමීන් වහන්සේලා සඟ සතු භාවයෙන් ඉතා ප්‍රවේශමෙන් පරිහරණය කරති. අද ඉන්න අය පමණක් නොවේ. අනාගතයෙහි පැවිදි වී සංඝරත්නයට ඇතුළත් වෙන ස්වාමීන් වහන්සේලාගේ ද ප්‍රයෝජනයට ගන්නා බැවින් ඒවා වර්තමාන අනාගත සංඝයා උදෙසා පිදුවා වන බැවින් දායකයන්ට අතිශයින් මහත්ඵල වේ.

බොහෝ වියදම් කර බොහෝ කරදර කර, දුර සිට ස්වාමීන් වහන්සේලා ගෙන්වා දෙන ආහාර පැය කීපයකින් අසූචි බවට පත් වේ. ගෙන යාමට පූජා කළ පිරිකර දින කිහිපයකින් ම අභාවයට පත් වේ.

අතීත ශ්‍රද්ධාවන්තයෝ සංඝරත්න උදෙසා දන් දී ඇත්තේ සසරින් එතෙරව නිවන සඳහා ය. එහෙත් අද සාංඝික දාන දෙන්නේ ම මැරුණ අය සඳහා ය. ජීවත් වෙන අයට ආශිර්වාද පතා ය. හේතුව රැලේ යාම යි. දන්නේ එපමණ ය. හත් දවසෙත්, තුන් මාසෙත් දෙන දානය මිත්‍යා දිට්ඨියන් කිළිටිව ඇති නිසා මහත් ඵල නොවේ. බොහෝ පැවිද්දන් ගෙන්වා ශබ්ද ඝෝෂා කරමින් දෙන දාන මාන්නයෙන් කිළිටි වන බැවින් ද මහත්ඵල නොවේ. එතැන් සිට අවුරුදු පතා සිය වසක් දුන්නත් දෙන්නේ කන බොන දේ සහ චීවරාදී යම් පිරිකර වශයෙන් එකම දේ ය.

මැරුණ කෙනා පරදත්තූප ප්‍රේතයෙකු වී එම පින් අනුමෝදම් වුවහොත් ඔහුට ලැබෙන්නේ කෑම බීම වස්ත්‍රාදිය පමණි. වාසස්ථාන නොලැබේ. එයට හේතුව වැපිරූ දෙයට අනුව අස්වැන්න ලැබීම ලෝක ධර්මතාවය යි. හේතුඵල දහමම යි. තමාට පින් ඵල විපාක දෙන විට

ලැබෙන්නේ ද එම දේවල්ම ය. කොතෙක් බණ දෙසුවත්, කොතෙක් බණ ඇසුවත් අවබෝධය නොලබෙන්නේ චාරිත්‍රයෙන් සියල්ල නිම වීම සහ රටාවට හුරු වීමයි. විවිධත්වය විසිතුරු බව තුළින් අර්ථ සම්පාදනයට වීමංසා බුද්ධියත් දන්නා අය පෙන්වා දෙන දෙය පිළිගැනීමට නිහතමානී බවත්, තමාගේ වැරදි දෘෂ්ඨිය බැහැරලීමට නම්‍යශීල බවත් සත්‍ය තේරුම් ගැනීමට ප්‍රඥාව තිබිය යුතුම යි. අපගේ මේ උත්සාහය ඒ සඳහා කණාමැදිරි එළියක් ලබා දීමයි. කණා මැදිරි එළිය තුළින් තරු එළිය, සඳ එළිය, හිරු එළිය සොයා යාමට පාඨකයාට ඉඩ තබමින් මේ දන කථාව මෙයින් නිමවමි. ඔබට හොඳ නුවණම ලැබේ වා.

සාදු! සාදු!! සාදු!!!